සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
ISSN 1800-1459

# පුවක් ගස හා බැඳි ජන සංස්කෘතිය

**එම්.එස්.එම්.එල්. කරුණාරත්න**

භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය, මාතර.

## සාරසංක්ෂේපය

මිනිසා හා සොබා දහම අතර වූ සබැඳියාව, මිනිසා හා ගස් කොලන් අතර වූ සබැඳියාව වන තරමට ම සමීප ය. මිනිසා හා ගම අතර වූ බැඳීම් අධ්‍යයනය කරන මානවවංශ උද්භිද විද්‍යාව (Ethno- botany) වැනි විෂය ශික්ෂණයක් ඉහත සබඳතා ගැඹුරින් විග්‍රහ කරයි. මෙම ලිපිය එබඳු විෂය ක්ෂණයක් ගුරුකොට නොගන්නා නමුත් "පුවක් ගස හා බැඳි ලාංකික ජන සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීම අරමුණු කොට ගනී. ඒ යටතේ ප්‍රජාවගේ ජීවන ව්‍යවහාර හා බැඳි පුවක් ගසේ ඵල ප්‍රයෝජනත් යම් ශාඛයක් වටා භාෂා ව්‍යවහාරයන් හා ජන සාහිත්‍යයක් නිර්මාණය වීමත් ආදිය පිළිබඳ ව සුවිශේෂී අවධානය යොමු කෙරේ.

ඉලක්කගත සම්මුඛ සාකච්ඡා විවෘත සම්මුඛ සාකච්ඡා සෘජු නිරීක්ෂණය හා ඡායාරූප ලබා ගැනීම ආදී ක්‍රම යොදාගත් ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා භාවිත කළ අතර ද්විතීයික මූලාශ්‍රය වශයෙන් ක්ෂේත්‍රය පිළිබඳ ව ලියවී ඇති පැරණි හා නූතන මූලාශ්‍රයන් ඇසුරු කෙරේ. හැකි සෑම විටෙක ම මුල් කෘති පරිශීලනයට උත්සාහයක් ගත් අතර එය දුෂ්කර වන අවස්ථාවලදී පමණක් ඉන් බැහැර විය. කෙසේ වුව ද ක්ෂේත්‍රයේ දී රැස් කරන ලද දත්ත හා තොරතුරු කෙරෙහිවැඩි අවධානයක් යොමුකර තිබේ. සිංහරාජය, පරකඩුව, ශ්‍රී පලාබද්දල හා අකුරැස්ස ආශ්‍රිත ගම්මාන කීපයක් ක්ෂේත්‍රීය දත්ත රැස් කිරීම සඳහා පාදක කර ගන්නා ලදී.

මෙම අධ්‍යයනය අනුව නිගමනය කළ හැක්කේ යම් ජන සමාජයක යම් ශාකයක් වටා නිර්මාණය වන්නා වූ සංස්කෘතික හා සමාජීය බැඳීම් එම සමාජයේ ජීවන ව්‍යවහාරයන් සමඟ තදනුබද්ධ ව පවතින බවත් එම බැඳීම් එම ශාක සන්තතියේ පැවැත්මට ද සෘජුව දායකත්වය ලබා දෙන බවත් ය. ලාංකික ජන සංස්කෘතිය තුළ පුවක් ගස එබඳු ශාකයකට සජීවී නිදසුනකි.

**කේන්ද්‍රීය වචනː** පුවක්, මානව සබඳතා, ජන සංස්කෘතිය,ඉතිහාසය, ජනශ්‍රැතිය

## හැඳින්වීම

මිනිසා සහ ශාක අතර පවත්නා සබඳතාව මානවයාගේ සම්භවය දක්වා ඈතට දිවයන්න කි. තැන තැන ඇවිද ආහාර රැස්කරමින් ජීවත් වූ මානවයා, තම ආහාර සඳහා අවැසි ශාක වර්ග වගා කිරීම ආරම්භ කිරීම (ශාක ගෘහස්තකරණය) ඔහු මෙතෙක් ආ ගමන් මග තීරණාත්මක ලෙස වෙනස් කළේ ය. එය මිනිසා හා ශාක අතර එතෙක් පැවති සබඳතාවට වෙනස් ස්වරූපයක් ගත්තේ ය. පළමුවෙන් ඔහු වගා කළේ ආහාර සඳහා අවශ්‍ය බෝග පමණක් වුව ද, වනජ ද්‍රව්‍ය රැස්කළ අවධියේ පැවැති ඇබ්බැහිකම් වලින් ඔහුට පූර්ණ ලෙස අත්මිදිය නොහැකි විය. එසේ රැගෙන ආ වෙනත් ද්‍රව්‍යය ඔහු සිතා මතා වගා නො කළත් ප්‍රයෝජනයට ගෙන ඉවත දමන වනජ ද්‍රව්‍යවල බීජ, අල, මුල්, කැබලි වලින්

මිනිසාට ප්‍රයෝජනවත් ශාක සන්තතියක් ඔහුගේ නේවාසික ප්‍රදේශය ආශ්‍රිත ව නිර්මාණය වන්නට ඇතැයි සිතිය හැකි ය. නිවර්තන කලාපය තුළ එසේ නිර්මාණය වූ ශාක සන්තතියෙන් පුවක් ගස සුවිශේෂී වේ. පුවක් ගස මෙම කලාපීය ප්‍රජාවගේ ජීවන ව්‍යවහාරයන් සමඟ තදින් බැඳී පැවතීමත්, ඔවුන්ගේ නේවාසික කලාප ආශ්‍රිත ව පුළුල් ව්‍යාප්තියක් පෙන්වීමත් මීට හේතු වේ. ඝණ වනාන්තරවල පුවක් ගස ව්‍යාප්තියක් නොපෙන්වන අතර නැගෙනහිර අප්‍රිකානු, දකුණු ආසියානු සහ පැසිපික් කලාපීය දූපත්වල මිශ්‍ර වගා බිම් හෝ වන ලැහැබ්වල පුවක් ගස ව්‍යාප්ත වී ඇත. නිවර්තනික තෙත් දේශගුණික තත්ත්වය (Tropical everwet climate) මෙහි වර්ධනයට හා ව්‍යාප්තියට හේතු වේ (Staple, 2006:01).

නිවර්තන කලාපීය රටක් ලෙස ලංකාවේ ද පුවක් ගස පුළුල් ව්‍යාප්තියක් හඳුනාගත හැකි අතර (විශේෂයෙන් පහත රට තෙත් කලාපයේ) එය හුදෙක් උද්භිත විද්‍යාත්මක අගය ඉක්මවා ගිය සමාජ සංස්කෘතික වටිනාකම් හා බැඳීම් සමූහයක් සහිත ශාකයක් ලෙස හඳුනා ගත හැකි ය. මෙම අධ්‍යයනයේ දී පුවක් ගස හා බැඳි ජන සංස්කෘතිය හඳුනා ගැනීමට උත්සාහ ගැනේ.

## සාහිත්‍ය විමර්ශනය

### පුවක් ගසේ උපත

සිංහල ජනයා අතර ප්‍රචලිත වෘක්ෂජනශ්‍රැතියෙහි ද ගහකොළ හා සම්බන්ධ උප්පත්ති කථා ගනණාවක් විද්‍යාමාන වේ. මේ කථා අතරින් සමහරක් වෘක්ෂයන්ගෙන් හා මල්ඵලාදියෙන් උපන් පත්තිනි, ඉලන්දාරි දෙවි, සඳුමල් බණ්ඩාර හා නාමල් කුමර ආදි දෙවිදේවතාවියන් වටා ගෙතී ඇත (දනන්සූරිය, 2009:423). පුවක් ගස එහි විවිධ කොටස් ජන දිවියේ උපයෝජනීය අංග ලෙස බැඳී පවතී. විශේෂයෙන් ම දෙවි දේවතාවුන් යක්ෂ, ප්‍රේත, දිෂ්ටි ආදි අධිමානුෂීය බලවේගයන්, විශ්වාසයන් පිළිබඳ සමාජ, සංස්කෘතික ව්‍යවහාරයන් තුළ මෙය වඩාත් ඉස්මතු වේ. මෙයින් පැහැදිලි වන්නේ පුවක් ගස හා සම්බන්ධ සැඟවුණු අභිචාරාර්ථයක් පවතින බව ය. ඒ අනුව එවැනි රුකක් පිළිබඳව අධිමානුෂ බලවේග ද සම්බන්ධ වූ උප්පත්ති කථාවක් නිර්මාණය වීම ස්වභාවික ය.

පුවක් ගසේ උප්පත්ති කථාව වැඩි වශයෙන් ප්‍රචලිත වූවක් නොවේ. එහි දැක්වෙන අන්දමට පුවක් පුවඟු දිවයිනෙහි උපත ලබයි; දෙවියන් විසින් ලක්දිවට ගෙන එනු ලබයි. ඉක්බිතිව විෂ්ණු දෙවියන්ගේ උද්‍යානයෙහි රෝපණය කෙරෙයි (දනන්සූරිය, 2009:437).

පූවඟු දිවයිනේ රුක මුල පලද වා
මේ දිවයිනට දෙවියෝ ඇරගෙන ආ වා
විෂ්ණු දෙවියන්ගෙ උයනේ පිහිටෙව් වා
එදා සිට පුවක් නරලොව පවතින වා (මහේන්ද්‍ර, 1993:148).

ඉහත කවියට අනුව පුවක් උපත ලබන්නේ පූවඟු දිවයිනේ ය. ඇතැමෙක් එය ජන සාහිත්‍යයේ එන මනඃකල්පිත දිවයිනක් ලෙස සලකති. තවත් අය එම අදහස දිවයිනේ උතුරු ප්‍රදේශයේ කුඩා දිවයිනක් හා සම්බන්ධ කරති.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
*ISSN 1800-1459*

## පුවක් ඉතිහාසය

පුවක් හා හුණු එකතුව බුලත් විට සැපීම ලංකාවේ ඉතා ප්‍රචලිත ව පැවති සිරිතක් බව මහා වංශයෙන් පැහැදිලි වේ. කාවන්තිස්ස සමයේ මේ සිරිත පැවතුන බව සහස්සවතථුව කියයි. දන් දීමේ දී භික්ෂූන්ට දැහැත් විට පිළිගැන්වීමේ අනිවාර්ය චාරිත්‍රය එදා ද විය (එල්ලාවල, 1994:120). අනුරාධපුර මුල් අවධියේ සිටම ලාංකික සංස්කෘතියේ අවියෝජනීය අංගයක් ලෙස බුලත් විට සැපීම බැඳී පැවතියා නම්, පුවක් භාවිතය ද ප්‍රචලිත වූ බවට සැකයක් නැත. 'පුවක් වගාව ද පැවති බව මහා වංසයේ තැනින් තැන ලැබෙන තොරතුරු වලින් කිව හැකි ය' (එල්ලාවල, 1964:120). පුවක් වගාවක් ලෙස කෙසේ වුව ද දෛනික ජන ජීවිතයේ අවශ්‍යතා සඳහා ගෙවතුවල වූ ගස් ගොන්නට එකතුව පැවැති බවට ඉන් අදහසක් ලැබිය හැකි ය. මන්ද පුවක් ගසේ ව්‍යාප්තිය සැලකූ විට වියළි කලාපයට සාපේක්ෂ ව එහි පුළුල් ව්‍යාප්තියක් දක්නට ඇත්තේ තෙත් හා අතර මැදි කලාපවල වීමයි. කෙසේ වුව ද පුවක් වැවෙන ප්‍රදේශවල සිට වෙනත් ප්‍රදේශවලට පුවක් හිඟ කාලයේ දී ඒවා වෙළඳ ද්‍රව්‍යයක් ලෙස හෝ රැගෙන එන්නට ඇතැයි සිතිය හැකි ය. 'බුලත් කෑමේ සිරිත ජාතික ලක්ෂණයක් තරමට පත්වී ඇත. වැඩි පුරම බුලත් කන්නේ භික්ෂූන් වහන්සේ හා මහලු ස්ත්‍රී පුරුෂයෝ ය. බුලත් විටකට බුලත් කොළ ස්වල්පයක් හා අමු හෝ වියළි පුවක් කහ මිශ්‍ර කළ හෝ නො කළ හුණු ද ඇතුළුවේ. මෙය සුවඳවත් හා සැරවීමට ද තවත් ද්‍රව්‍ය එකතු කරනු ලැබේ. එනම් සුවඳවත් හා සැරවීමට ද තවත් ද්‍රව්‍ය එකතු කරනු ලැබේ. එනම් කරඳමුංගු, කරාබු නැටි, දුම්කොළ, බැම්මල්, කුළුබඩු ආදී වශයෙනි. විටට ඕනෑ කරන ප්‍රධාන ද්‍රව්‍ය දුර්ලභ වන ඇත පිටිසර වැසි ජනයා කහට පොතු, කොළ වර්ග හා පුවක් මුල් හා හුණු භාවිත කරයි (විජේසේකර, 1986:120:121). නුවර යුගය වන විට ද බුලත් කෑමේ පුරුද්ද ලාංකීය ජනයා අතුරින් ගිලිහී නොගිය බව මේ අනුව වටහා ගත හැකි ය. විටට අවැසි මුල ද්‍රව්‍ය අතර පුවක් දෙවැනි වන්නට ඇත්තේ බුලතට පමණක් වන්නට ඇත. පුවක් පමණක් නොව බුලත් විටට තවත් ශාක කොටස් අවැසි වූ බව පෙනේ. කහට පොතු පුවක් වලට ආදේශකයක් විය.

II වන රාජසිංහ රජුගේ සිරකරුවකු ලෙස මහනුවර ජීවත් වූ රොබට් නොක්ස් දිවයින පිළිබඳ රචනා කරන ලද 'An Historical Relation of the Island Ceylon' කෘතියේ දිවයිනේ ශාක පිළිබඳ ව කරනු ලබන විස්තරයේ දී පුවක් ගහ එහි ඵල ප්‍රයෝජන පිළිබඳ ව දීර්ඝ වශයෙන් කරුණු දක්වා තිබේ. සමකාලීන සමාජයේ පුවක් ගසට තිබූ සමාජීය වැදගත්කම ඉන් මනා කොට අවබෝධ කරගත හැකි ය. නොක්ස් ගේ පුවක් ගස පිළිබඳ ළඟන්නා සුළු විස්තරය පහතින් උපුටා දැක්වේ.

මේ දිවයිනේ පල වර්ග අතර ඉල්ලුම අතින් මුල් තැනක් ගන්නා වර්ග පිළිබඳ විස්තර මම දැන් ඉදිරිපත් කරමි. මම ඒ විස්තරය පුවක් ගෙඩියෙන් පටන් ගනිමි. දිවයිනේ දකුණු හා බස්නාහිර පෙදෙස්වල පුවක් බහුල ව වැවෙයි. ගම්වල විනා කැලයේ නො වැවෙයි. එක ගොන්නට වැවී තිබෙන පුවක් ගස් බොහෝ ගණනක් අතුරින් එක් එක් පුද්ගලයාට අයත් ගස් වෙන් කොට හඳුනා ගැනීම සඳහා වැට කඩුලු හා මායිම් නැතත් වෙනත් විශාල ගස්, කඳු ගැට හා ගල් කුට්ටි යනාදිය මායිම් සුලකුණු වශයෙන් ගෙන තම තමන්ට අයත් පුවක් ගස් තෝරා බේරා

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
ISSN 1800-1459

ගන්නට මෙහි ගැමියෝ සමත්හු ය. ඔවුහු පුවක් වගා නොකරති. තිබෙන ගස්වල ගෙඩි ඉදී ගස් යට වැටී ඒවායින් තවත් පැළ හට ගෙන කෙමෙන් වැඩෙයි. ඉතා ඍජුව උසට වැවෙන පුවක් ගස මහතින් මිනිසෙකුගේ කෙණ්ඩට වැඩි තරම් නොවේ. පුවක් ගෙඩි ගස මුදුනේ වලු වශයෙන් හට ගනී. ඉදෙන විට නෙත් කලු රත් පැහැයකට හැරී පියකරු පලතුරක් සේ දිස් වෙයි. ගස් හිමියෝ මෙය එකතු කොට ගෙන, ලෙල්ල තරමක් තුණු වන තෙක් ගොඩ ගසා තබති. ඉන් පසු අව්වෙහි දමා වේලා ගෙන එයින් ද අනතුරු ව තියුණු ලී හුලකින් එකිනෙකේ ලෙල්ල ඉවත් කරති. ඇතැම් පුවක් ගසකින් වරකට ගෙඩි පන් සියයක් පමණ ද ඇතැම් ගසකින් දහසක් හෝ එක් දහස් පන් සියයක් පමණ ද අස්වනු ලැබෙන අතර වරකට ගෙඩි තුන් හාර සියයයකට වැඩි පලදාවක් නො දෙන ගස් ද ඇත්තේ ය. පුවක් ගසක් පල දරන්නේ සාමාන්‍ය වශයෙන් අවුරුද්දකට වරක් පමණකි. එහෙත් අවුරුද්ද පුරා ම කන්නට සෑහෙන තරම් අමු පුවක් පලදාවක් එක් ගසකින් ලැබේ.

පුවක් අතු තරමක් දුරට පොල් අතුවලට සමාන ය. පුවක් අත්තක් දිගින් අඩි පහක් හෝ හයක් පමණ වන අතර කුරුලු පිහාටුවක තිබෙන සිහින් පෙද මෙන් පුවක් අත්තේ ද මැද ඇති නාරටියෙන් දෙපසට පත්‍ර විහිදී තිබේ. සිංහලයෝ මේ පත්‍ර “කොල” යනුවෙන් ද දෙපසින් වැඩුණු කොළ සහිත නාරටිය "අත්ත" යනුවෙන් ද හඳුන්වති. පුවක් අතු, ඒවා ගසෙහි රඳවන පතත් සමගම අවුරුදු පතා ගසින් ගිලිහී වැටෙයි. පුවක් අත්ත විහිදී වැඩෙන්නේ ගසේ කඳෙහි එති ර දෙන කොළපතේ උඩ කෙළවරින් ය. ගෙඩි හට ගන්වන පුවක් මල කෙමෙන් වැඩෙද්දී ඊට ඉඩ දී, කොළපත ඊට සම්බන්ධ අත්තත් සමග ම බිම පතිත වෙයි.

සම් කඩක් වන් කොළපත ගමේ මිනිසුන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් ය. බත් ලා ගෙන කෑම සඳහා ඔවුහු පිඟානක් වෙනුවට කොළපත පාවිච්චි කරති. දුර ගමන් යන්නෝ අතර මග දී අනුභව කරනු පිණිස බත් මුල් බැඳ ගෙන යෑමට ද කොළපත පාවිච්චි කරති. කොළපත හරි මැදින් දෙකට නමා ගෙන එහි දෙපොට ම හසු වන සේ දෙපසින් හකුළා පහියක් සේ සකසා ගත් විට හොදි සහිත ව්‍යඤ්ජන හෝ තෙල් හෝ වතුර ආදී ද්‍රවයක් හෝ පහියෙන් පිටතට කාන්දු නො වන හෙයින් දුර ගමන්වල දී ඉතා පහසුවෙන් කෑම් බීම් රැගෙන යෑම සඳහා ඔවුහු කොළපත පාවිච්චි කරති. එක් එක් පුවක් ගසේ ප්‍රමාණය අනුව කොළපත ලොකු හෝ කුඩා හෝ වන නමුත් සාමාන්‍යයෙන් එය දිගින් අඩි දෙකක් පමණ ද පළලින් අඩියක් හෝ එක හමාරක් පමණ ද වෙයි. මේ දිවයිනේ හෝටල් හෝ භෝජන ශාලා නැති හෙයින් දුර ගමන් බිමන්වල දී තමනට අවශ්‍ය කෑම් බීම් මෙසේ කොළපත්වල ඔතා රැගෙන යෑම මෙහි වැසියන්ගේ සිරිතකි.

පුවක් ගසේ කඳ මැද ඉතා මෘදු මදයක් හෙවත් බඩයක් වෙයි. එහෙයින් පුවක් කඳ එක් කෙළවරක සිට අනෙකට ඉතා පහසුවෙන් පැලිය හැකි ය. පුවක් ලීය ඉතා දැඩි ය, ශක්තිමත් ය. මෙහි වැසියෝ ඔවුන්ගේ ගෙවල්, පියස්සේ රීප්ප වශයෙන් ද බිම සිටුවන ලද ඉනි එකිනෙක යා වන සේ හරස් අතට තබා බඳින මාවර හැටියට ද පුවක් ලී පාවිච්චි කරති. එසේ වැටවල් බැඳීම සඳහා ඔවුහු කැලයෙහි වැවෙන නොයෙක් වැල් වර්ග යොදා ගනිති.

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79*
*ISSN 1800-1459*

මේ රටේ මුදල් බහුල නො වේ. එහෙත් ඉතා හොඳ වෙළෙඳ භාණ්ඩයක් වශයෙන් මෙහි සිට කොරමණ්ඩල වෙරළට යැවෙන පුවක් වෙනුවෙන් ලැබෙන ආදායමෙන් මෙහි වැසියෝ ඔවුනට අවශ්‍ය සියලු දේ ලබා ගනිති. මා මේ දිවයිනට පැමිණි කාලයේ පැවැතුණාක් මෙන් වෙළෙඳාම සරුවට කරුණු වකවානුවල පුවක් විසි දහසක සාමාන්‍ය මිල ඩොලරයක් පමණ විය. එහෙත් දූන්, පුවක්, ගස් යට වැටී එක්කෝ පැළ වෙයි. නැත හොත් ගස් යට ම කුණු වී යයි. සමහර පුවක් වර්ග, එය කෑමට ගන්නා තැනැත්තා මත් පැන් පානය කළ විටෙක මෙන් මත් කරන්නට ඔහුගේ හිසේ තෝන්තු ගතියක් ඇති කරන්නටත් සමත් ය.

ගොවියාගේ පටන් මහරජු දක්වා හැම තරාතිරම්වල ජනයා බුලත් කෑම සිරිතක් වූයෙන් ඒ සඳහා භාවිත වූ විසිතුරු භාජන ද ඇත (විජේසේකර, 1986:121). බුලත් පහිය, බුලත් මල්ල, බුලත් කොක්කනය බුලත් විටට අවැසි ද්‍රව්‍ය රැගෙන ගිය මල්ල විය. එය ඉනේ ගසා ගෙන යාමට හෝ අතේ රැගෙන යාමට පහසු වන ලෙස සකස් කරගත්තක් විය. බොහෝ විට එය සත්ත්ව සමින් නිර්මාණය විය. බුලත් හෙප්පුව, පෙට්ටිය, බුලත් වට්ටිය, නිවසකට පැමිණි අමුත්තෙකුට බුලත් විට පිළිගැන්වීම සඳහා භාවිත විය. බුලත් හෙප්පුව වෙනත් සංස්කෘතික අංග රාශියක් සමඟ ද බැඳී පැවති අතර වේවැල්, බටපොතුවල සිට පිත්තල, රිදී ආදී ලෝහවලින් පවා නිර්මාණය විය. කිල්ලෝටය හුණු දැමීම සඳහා ද ගිරය පුවක් සුද්ද කිරීම, ඒවා ලිවීම හා කැබලි කර ගැනීම සඳහා ද භාවිත විය. නුවර යුගය වන විට ගිරය අවශ්‍යතාව ඉටු කිරීම ඉක්මවා ගිය කැටයම්වලින් අලංකාර කළ මෙවලමක් බවට පත්ව තිබුණි. විට කෙළ ගැසීම සඳහා භාවිත කළ පඩික්කම ද එසේ අලංකාර කැටයමින් හැඩ වූ මෙවලම් බවට පත්ව තිබුණි. විට සැපීම අපහසු වූ වයෝවෘද්ධ පුද්ගලයන්ට විට කොටා ගැනීම සඳහා උපකාරී වූයේ වංගෙඩිය හා මෝල්ගස ය. (කුඩා ප්‍රමාණයේ) මෙය සුලභව ම ලීවලින් නිර්මාණය වූ අතර නුවර යුගය වන විට එය ද සියුම් කැටයමින් අලංකාර විය. මෙම මෙවලම් ප්‍රභූ නිවෙස්වලට සීමා වන්නට ඇතැයි සිතිය හැකි වුවත්, බුලත් කෑම රජුගේ සිට ගොවියා දක්වා ම පැතිර තිබුණාට සැක නැත.

බුලත් පිළියෙල කිරීම හා රජුට පිළිගැන්වීම පණිවිඩ කරන නිලමේට හිමි රාජකාරියයි.' "දළු මුර" යන නම ලැබුණා වූ බුලත්වලට අමතර ව මීට අයත් අන්‍ය ද්‍රව්‍ය මෙසේ ය. සතරාකාරයක පුවක් - ගෙඩි පිටින් වේළන ලද, වේලා ලියන ලද, අමු සහ දියේ පොගවන ලද ඒ සතර වර්ගයයි. හුණුඃ මන්දඩු-මේ වූ කලී සුවඳැති පැළයක කැකුළු හා මුල් සංයෝගයකි. එනසාල්ඃ කපුරුඃ කයිප්පු - කහට සාර විශේෂයකි. සුවඳ සංයෝගයක්ඃ වැල් මී සාරයක්, රජ මේ සියල්ල එක විට භාවිත නො කළේ ය. අභිමත ලෙස වෙන වෙනම මිශ්‍ර කොට සැපී ය (සෝමරත්න, 2002:149). ඩේවි ගේ මෙම විස්තරයෙන් පැහැදිලි වන කරුණක් වන්නේ වැඩ වසම තුළ මෙම රාජකාරිය පැවති තිබූ අයුරුයි. බුලත් පුවක් හා සම්බන්ධ කරුණු රාශියක් ජෝන්ඩේවි. උඩරට සමාජය පිළිබඳ තම විස්තරයේ දී ඉදිරිපත් කරයි.

රජුගේ සිට ගොවීන් පමණක් නොව වනවාසි වැද්දන් පවා බුලත් විට සැපූ බව පෙනේ. 'වැද්දන් ද පුවක් හා හුණු සමඟ බුලත් කති. එහෙත් මේවා කැලයෙන් ලබා ගැනීම දුෂ්කර බැවින් ඒ වෙනුවට වැද්දන් වෙනත් දේ සොයාගෙන

ඇත........ මෙසේ හපන ද්‍රව්‍ය ජාති නම් දෙමට, බොල් විල්ල, කැප්පෙටිය, පලු. විර, කෝන්, මොර, දවට, ගල්කර, නුග, කලව, හබක යන මේවා ය (විජේසේකර, 2003:62). බුලත් හා පුවක් වනාන්තරය ආශ්‍රිත ගම්මානවලින් ලබා ගන්නට ඇතැයි සිතිය හැකි ය. මන්ද ඒවා වනාන්තරවල, විශේෂයෙන් ම එවුන් ජීවත් වූ වියළි කලාපිය වනාන්තරවල නොතිබූ බැවිනි. නුණු එවුන් විසින් ම සාදාගත් බවට සාක්ෂි තිබේ.

1505 ලංකාවේ වෙරළ බඩ ප්‍රදේශවල බලය අල්ලා ගන්නා පෘතුගීසින් කුරුඳුවලට අතිරේක ව පුවක් තම ප්‍රධාන වෙළඳ ද්‍රව්‍යයක් ලෙස සැලකූ බව පෙනේ.

කෝට්ටේ රාජ්‍යය තුළ පුවක් ගස වැඩුණේ යම් ගමක ද ඒ හැම ගමකින් ම රජයට පුවක් ප්‍රමාණයක් අයවිය යුතු විය. මේ තෝම්බුව පරීක්ෂා කිරීමෙන් බැසගත හැකි නිගමනයකි. වියළි කලාපයට අයත් ප්‍රදේශවල හැරෙන්නට කෝට්ටේ රාජ්‍යයේ අනිත් හැම තැන ම පාහේ පුවක් අරඹ එකල තිබූ හෙයින් රජයට සෑහෙන පුවක් ප්‍රමාණයක් එකල ලැබුණේ යැයි සිතිය හැකි යි. මේ පුවක් විකිණීමෙන් සෑහෙන ආදායමක් රජය ලැබී ය.

පෘතුගීසි රජයට පුවක් ලැබුණු මාර්ග දෙකකි. ඉන් එකක් කොටිකා බද්ද යි. කොටිකා බද්ද යනු ගබඩා ගම්වල වැසියන් විසින් පුවක්වලින් රජයට දුන් බද්දට ව්‍යවහාර වූ නමෙකි. කෝට්ටේ මහවාසල නඩත්තුව සඳහා වෙන් කොට තිබූ ගබඩා ගම්වල උපදින දෙයින් කොටසක් රජයට දීමක් වශයෙනි එය සැලකිය යුත්තේ. සිංහල රජුන් පුවක් ලබා ගත්තේ ගබඩා ගම්වලට අයත් මුත්තෙට්ටුවලින් පමණකැයි 1636 දි ඉදිරිපත් කළ පෙත්සමේ සඳහන් වේ. මේ ප්‍රකාශය තෝම්බුවේ එන කරුණුවලින් තවදුරටත් තහවුරු වේයි. 1615 දි කොටිකා බද්ද මගින් රජයට පුවක් ලැබුණේ ඒ වනවිට ඉතිරිව තිබූ ගබඩා ගම්වලින් පමණකි. එනම් බුලත්ගමින් අමුණු 375 ක් හා දෙනවක මැණික් ගරන ගම්වලින් අමුණක් ද වශයෙනි. උසවේදු ගේ කාලයේ දි රජය කොටිකා බද්ද වශයෙන් පුවක් අමුණු 376 ක් පමණක් එක්කාසු කළ නමුත් කෝට්ටේ රජවරුන් දවස නම් ඊට වැඩි ප්‍රමාණයක් ඔවුන් ලැබූ බව නිසැකු ය. එකල ගබඩා ගම් වැඩි ගණනක් තිබූ හෙයිනි.

කොටිකා බද්දෙන් ලැබෙන පුවක් හැරෙන්නට රජය එකල පුවක් මිල දී ගැනීමේහි ද යෙදුණි. පුවක් ගස් වැඩුණු හැම ගමකින් ම එක්තරා පුවක් ප්‍රමාණයක් රජයට විකිණීමට අනිවාර්ය විය. මෙසේ විකුණු පුවක් අමුණක් සඳහා රජය පෙවුයේ රිදී හතරකි. රජය පුවක් මිල දි ගැනීමේ සිරිත කවර දිනක ඇරඹින ලද්දක් ද? මේ ප්‍රශ්නයට ස්ථිර පිළිතුරක් නො දිය හැකි යි. කේරෝප්ගේ කෘතියේ උපුටා දක්වා ඇති 1636 දී ලංකා ප්‍රතිකාල් අධිකාරින්ට ඉදිරිපත් කරන ලද පෙත්සමේ සඳහන් වනුයේ මුල දී පෘතුගීසි රජයට පුවක් විකිණීම අනිවාර්ය නො වූ නමුත් පසුව හැම නිෂ්පාදකයා ම එසේ කළ යුතු වූ බවයි. එහෙත් සීතාවක රාජසිංහගේ නිලධාරින් රජය සඳහා බෙන්තොට අලුත්ගමින් පුවක් මිල දී ගත් බවත් තෝම්බුවේ සඳහන් වේ. 1596 දි කොළඹ ෆ්‍රැන්සිස්කානු පූජකාරාමයේ නායක පූජක තැන කිවේ ද ධර්මපාල රජු පුවක් වෙළදාමෙන් සෙරපිම් 40,000ක ආදායමක් ලැබූ බවයි. 1597 ට පෙර පවා රජය පුවක් මිල දි ගන්නට ඇතැයි මේ කරුණුවලින් සිතීමට ඉඩ තිබේ. අසවේදු හා තෝමේ ද සූසා අරෝංවෙස් යන දෙදෙන පුවක් වෙළදාම තමන් අතට ගෙන අනිත් අයට එය තහනම් කළ බවත් ඒ පූජක තැන

ම කියයි. අසවේදූ ඒ වෙළදාමේ යෙදුණු බව කේරෝස්ගේ කෘතියෙන් ද පෙනේ. ඒ ආදායමෙන් තමන් ලංකාවේ හමුදාවට අවශ්‍ය හාල් සපයා ගත් බව අසවේදූ ම පසුව කීය. මේ නො පැහැදිලි හා එකිනෙකට ප්‍රතිවිරුද්ධ ප්‍රකාශ කිහිපය නිසා අපට බැසගත හැක්කේ අස්ථිර නිගමනවලට ය. කෝට්ටේ හා සීතාවක පාලකයන් අතර පුවක් මිල දී ගැනීමේ පුරුද්දක් පැවති බවත් අසවේදූ ලංකාවට පත්ව ආ විට පුවක් මිලයට ගැනීමේ තනි අයිතිය යුතු පුවක් ප්‍රමාණය එහි වාර්තා ගත කරන ලදින් මුල දී ගෙවූ රිදී හතරේ මිලට රජයට පුවක් සැපයීම අනිවාර්ය විය. පෘතුගීසී පාලනයෙන් පසුව ආ ලන්දේසීන් ද රජය ලබා ගත් පුවක්වලට ගෙවූයේ පළමු පැවති මිල ගණන් ම ය. රජය මේ ජාවාරමට බැසීම නිසා පෘතුගීසී හා ලන්දේසි යන දෙපක්ෂය යටතේ ම ලක්වැසියාට බොහෝ දුක් ගැහැට සිදු වූ බවට පැමිණිලි රාශියකි.


බැල්තසාර් මරිඤ්ඤෙදෝ පෘතුගීසි රජයට ලැබිය යුතු පුවක් ප්‍රමාණය පිළිබඳ ව විස්තරයක් බඳු ලේඛනයෙන් සපයයි. මෙම විස්තරය අනුව රජය පුවක් අමුණු 4,111ක් මිල දී ගත් බව පෙනේ.

එදා පුවක් ජාවාරමෙන් රජය සෑහෙන ලාභයක් ලැබුවා ය. පුවක් අමුණු 4,400ක් විකිණීමෙන් රජයට සෙරපීම් 17,090 ක ආදායමක් ලැබිය යුතු ය. 1615 දී ෆෙයිරේ වාර්තා කෙළෙන් අමුණක් සෙරපීම් 4කට පමණ විකුණන ලද බවත් එක අමුණකින් රජය රිදී 8 ක ලාභයක් ලැබූ බව පෙනේ. රජය සතු වූ පුවක් දිවයින තුළ ඔබ මොබ ගෙනයෑම මඩිහේ ජනයාට අයත් රාජකාරියක් වූයෙන් ඒ සඳහා වියදමක් නො දරූ නිසා රජය පුවක් වෙළදාමෙන් 200%ක ශුද්ධ ලාභයක් ලැබූ බව පෙනේ.

ලංකාවේ පුවක් මිල දී ගත්තෝ කවරහු දැයි ස්ථිරව දැන ගනීමට ප්‍රමාණවත් සාක්ෂි පෘතුගීසි ලිපි ලේඛනාදියෙන් නො ලැබේ. එහෙත් අද මෙන් ම එදත් පුවක් වැඩිපුර ම පැටවූයේ දකුණු ඉන්දියාවට බව කිව හැකියි. බුලත් සැපීමෙන් ලාංකික ජනයාට දෙවැනි නො වූයේ දකුණු ඉන්දියානු ජනයා පමණක් හෙයිනි. දකුණු ඉන්දියාවේ මදුරායි හා තන්ජෝරය අනාදිමත් කාලයක සිට ලංකාවේ පුවක් මිල දී ගත් ප්‍රදේශ බව පෙනේ. මේ වෙළඳ සම්බන්ධතාව බිඳ දැමීමට නො රිසි වූ පෘතුගීසීහු එය රැකගත්හ. නාගපට්ටනමේ හා සන් තෝමසේ ප්‍රතිකාලුන් හා කොරමැණ්ඩල වෙරළබඩ ප්‍රදේශයට අයත් හින්දූ ජනයා ලංකාවට රෙදි ගෙනවුත් ලංකාවෙන් පුවක් ආපහු ගෙන ගිය බව 1615 දී ඕලන්ද ජාතිකයෙක් වාර්තා කෙළේ ය. 17 වන සියවසේ අවසාන භාගයේ දී ද ලංකාවේ පුවක් මිල දී ගත්තේ දකුණු ඉන්දියාවේ ජනයා ය. ලංකාවේ පුවක් විකිණීමෙන් ලැබුණු මුදල් තමා ලංකාවේ හමුදාවට හාල් සැපයීම සඳහා යෙදූ බව අසවේදූ වාර්තා කළ බව ඉහත සඳහන් කරන ලදී. ලංකාවේ ප්‍රයෝජනය සඳහා වර්ෂයකට හාල් පාරම් 300ක් මසුලිපට්ටනමේ දි භාරදීමට 1589 දී ගොල්කොණ්ඩාවේ පාලකයා පෘතුගීසීන් සමඟ ගිවිසුමකට බැඳුණු බවට සාක්ෂි අප වෙත ලැබී ඇති හෙයින් අසවේදූ කාලයේදී ලංකාවෙන් පුවක් ඉන්දියාවට ගිය බවත් ඉන් ලංකාවට හාල් ලැබුණු බවත් කිය හැකි ය. තව ද මේ වෙළදාම ලංකාවේ ප්‍රාණනාලිය වී යයි ද මේ කාලයේ දී ලංකාවත් දකුණු ඉන්දියාවත් එක ම ආර්ථික ඒකකයක් වනී යැයි ද යන සින්නප්පා අරසරත්නම් මහතාගේ තර්කය මෙයින් තවදුරටත් සනාථ වේ (අබේසිංහ, 2005:146,14).

*ISSN 1800-1459*

මෙම දීර්ඝ විස්තරයෙන් අනාවරණය වන කරුණු කිපයකි. එනම් පෘතුගීසින් වැඩ වසම පුවක් වෙළඳාම සඳහා උපරිම වශයෙන් යොදා ගැනීමත්, නෛතික ප්‍රතිපාදන, නිලධාරි හා ආයතනික ව්‍යුහය, ඒ සඳහා සකස් කොට ගැනීමත්, සමාජීය, දේශපාලනික සහ ආර්ථික සම්බන්ධතා මෙම ක්‍රියාවලිය තුළ වෙනස් වූ ආකාරයත් සහ භූගෝලීය වශයෙන් පුවක් ගසේ ව්‍යාප්තිය ආදී තොරතුරුයි. ලන්දේසින් ද මෙම ක්‍රමවේදයන් ඉදිරියට පවත්වා ගෙන ගිය බවට සාධක හමුවන අතර ඉංග්‍රීසින් පුවක් වෙළඳාමට මුල් තැනක් නො දුන්න ද අත්හල බවක් නොපෙනේ.



දෙගල්දොරුව විහාරයේ පුවක් ගසක චිත්‍ර සටහනක්

## බෞද්ධ චිත්‍ර කලාවේ නිරූපිත පුවක් ගස

යම් කලා කෘතියක් එය බිහිවන ජීව පරිසරයෙන් කිසිලෙසකින් වියුක්ත නොවේ. තම දෛනික දිවිපෙවත පවත්වා ගැනීමට උපකාරි වූ ස්වභාවධර්මයට ත් ඊට අයත් ගස් වැල් සතා සිව්පාවන්ට ත් අතීත කලාකරුවා තම කෘතඥතාව පළ කළේ තම ජීවිතයේ නිරන්තර ගෞරවාදරයට පාත්‍ර වූ බෞද්ධ විහාරවල ඒවා සිත්තම් කිරීමෙනි. 19 ශත වර්ෂයේ දී ජාතක කතා චිත්‍රයට නැගූ හැම විටම ගසක් සිතුවම් කිරීමට අමතක නො කළ බව පෙනේ.

කථාවේ තේමාවට ගසක් අවශ්‍ය නොවූ විට පසුබිමෙන් ගස් දක්වීම සිරිතක් කර ගත්හ.

"සිංහලයාගේ අපූර්ව කලා කුසලතාවත් ධී ශක්තියත්, නිර්මාණශීලිතාවයත් මනාව පෙන්වනු ලබන හොඳම නිදසුන බෞද්ධ විහාර බිතු සිතුවම්හි වෘක්ෂලතා චිත්‍රයි" (මද්දුමාගේ,1993:09). මේවා සිත්තම් කිරීමේ දී වඩා නිදහස් රීතියක් අනුගමනය කළ බව පෙනේ. ඉන්දියානු සමාජ පරිසරය තේමා කරගත් චිත්‍රවල නිරූපිත ශාක තම දෛනික ජීවන රටාව තුළ දුටු ඵල ප්‍රයෝජන ලද දේශීය ශාක විය. කොස්, අඹ, පොල්, කිතුල්, පුවක්, තල්, කජු, නුග, කෙසෙල්, කොබෝලීල, දඹ, නා, අරලිය මීට නිදසුන්ය. විවිධ කාලවකවානුවල දී විවිධ චිත්‍ර සම්ප්‍රදායන් ගුරුකොට ගනිමින් මේවා නිර්මාණය කර තිබෙන අතර සමකාලීන ජන සමාජයේ ශාක හා මිනිසුන් අතර තිබූ සබැඳියාව ඉන් මැනවින් නිරූපිත ය.

පුවක් ගස ද අතීතයේ සිට ම මෙරට ජන ජීවිතය සමඟ බැඳී පැවතුණි. ඒ නිසා පුවක් ගස ශිල්පියාට තම සිතුවම් සඳහා නිරායාසයෙන් ම වස්තු විෂය විය. පොළොන්නරු යුගයට අයත් තිවංක පිළිමගෙයි නිරූපිත වෘක්ෂ සටහන් අතර පුවක් දක්නට ලැබේ. එහි තේමිය ජාතකය දක්වෙන සිතුවමේ වැඩි ඉඩක් ශිල්පියා වෙන්කර ඇත්තේ වෘක්ෂලතා නිරූපණය සඳහා ය. මෙම වෘක්ෂ නිරූපණයේ දී ශාඛා විහිදීම පත්‍ර විහිදීම පත්‍රවල හැඩය මල් ගෙඩි, ආදී සියලු උද්භිද ලක්ෂණ ඒ ආකාරයෙන් ම දක්වීමට උත්සාහ ගත් බව පෙනේ (මද්දුමගේ, 1993:27). 18 වන ශත වර්ෂයේ මැද සිට 19 ශත වර්ෂයේ මැද දක්වා වූ කාලය වන විට ශිල්පියා ශාක සිතුවම් කළේ යම් සංකල්පීය ක්‍රමයකට අනුවය. එහි දී පත්‍ර නිරූපණය සඳහා වැඩි අවධානයක් යොමු කළ අතර ස්වාභාවික පරිසරයේ

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
ISSN 1800-1459

දුටු ශාක ඒ අයුරින් ම සිතුවම් කිරීම වෙනුවට එහි ගති ලක්ෂණ කැටි වූ සංකල්පීය සම්ප්‍රදායකට ප්‍රවේශ විය. තල්, පොල්, කිතුල් හා පුවක් ආදී තාල වර්ගයේ ගස් දැක්වීම සඳහා මෙම පත්‍ර පද්ධති දැක්වීමේ සම්ප්‍රදාය අනුගමනය කර නැත. දනගිරිගල දෙගල්දොරුව විහාර චිත්‍ර මීට නිදසුන් ලෙස දැක්විය හැකි ය. පුවක්, කිතුල්, පොල්, තල් වැනි තාල වර්ගයේ ශාක සිතුවම් කිරීමේ දී මහනුවර යුගය මුළුල්ලේ ම යම් සුවිශේෂී ලක්ෂණ කීපයක් හඳුනා ගත හැකි ය. ඒවා නම් සෑම තාල වර්ගයේ ගසක ම ගසේ දෙපස පමණක් අතු දැක්වීම ත් ගසේ දෙපසට ම එකම ආකාරයෙන් දැක්වීමට ත් ය. එනම් එක් පසෙක ඇති අත්තක්, ගෙඩියක් මලක් කොලපුවක් අනෙක් පස ද ඒ අයුරින්ම දැක්වීම යි. එසේම මේ කාලය වන විට ශාක පත්‍ර නිරූපණයේ දී එකම වර්ණයේ (කොළපැහැය) ලා සහ තද පැහැ ස්වරූප ඉස්මතු කළේ ස්වාභාවික පත්‍රවල දළු හා කොල නිරූපණය සඳහා ය. නුවර යුගය වන විට පුවක් ගස විහාර සිතුවම්වල නිරූපණය කිරීම සෙසු අවධිවලට සාපේක්ෂ ව සුලභ වීම ශිල්පියා ජීවත් වූ වට පිටාව තුළ පුවක් ගස බහුල වූ නිසා සහ ශිල්පියාට පුවක් වඩා සමීප වූ නිසා වන්නට ඇතැයි සිතිය හැකි ය. ඇතැම් ජනශ්‍රැති මූලාශ්‍රයන් ද එසේ සිතීමට අනුබල දෙයි. පහත දැක්වනුයේ එබඳු ජනප්‍රවාදයකි.

> "මේක දඹුළු විහාරේ චිත්‍ර අඳින කොට සිද්ධ වුණු දෙයක් කියල තමයි කියවෙන්නේ. ඔන්න දූන් සිත්තරා දඹුළු විහාරේ වියන් චිත්‍ර ඇඳ ඇඳ ඉන්නවා. මේවා අඳින්නේ පලංචි ගහගෙන ඒවා උඩ නැග ගෙන හාන්සි වෙලා හෙම නොවැ. ඉතිං හැම වේලෙම පලංචියෙන් බහින්න හෙම අසීරු නිසා අවශ්‍ය කලමනා ළඟ ට කරගන්න, ගෝලයෙක් තියා ගන්න එක සිත්තරුන්ගේ පුරුද්දක්. මේ කියන සිත්තරා විට කන්න රුසියෙක්. ඉතිං ගෝලයට අනික් අඩුම කුඩුම සපයනවා වගේම සිත්තරාගේ කෙල පඩික්කමත් අරං දාන්න උනා. ඇයි ඉතිං විට කන පාරක් පාරක් ගානේ කෙල ගහන්න පලංචියෙන් බහින්න බෑනේ. ඔන්න ඔය කියන දවසෙන් සිත්තරා විටක් කලා "ඔන්න ඔය පඩික්කම අල්ලපන් කොල්ලෝ" කියල සිත්තරා චිත්‍රය අඳින ගමන්ම කිවුවලු. ඇයි ඉතිං අඳින චිත්‍රයටනේ සම්පූර්ණ අවදානේ. පඩික්කමත් ලං වුණා වගේ දැනුන නිසා සිත්තරා කෙළ ගහන්න පහල බැලුවම තමයි දෙලොව රත්වෙලා තියන්නේ, රාජසිංහ රජ්ජුරුවෝ පඩික්කම දික්කරගෙන ඉන්නව සිත්තරා දිහාවට. සිත්තරා දනිපනි ගාලා පලංචියෙන් බැහැලා නොදැන සිද්ධ වෙච්ච වරදට සමාව ඉල්ලලා බැගෑපත් වෙලා තියෙනවා. සිත්තරා හිතුවේ දූන් ඉතිං බත්කාලා හමාරයි කියලනේ. ඒත් රාජසිංහ රජ්ජුරුවෝ සිත්තරාට සමාව දුන්නා විතරක් නෙමෙයි. මේ කරන කාරියට ප්‍රසංසා කළා කියලා තමයි කතාවේ එන්නේ " (කල්‍යාණවති, 2010.01.04).

චිත්‍ර කලාවේදී පමණක් නොව චිරන්තන සාහිත්‍යයේ ද පුවක් පිළිබඳ තොරතුරු වර්ණනා හමුවේ. ඒ අතර පරිසර වර්ණනා කෙරෙහි සුවිශේෂී නැඹියාවක් ඇති සංදේශ කාව්‍යය වැදගත් වේ.

කෝට්ටේ යුගයේ දී තොටගමුවේ සිරි රාහුල හිමියන් විසින් රචිත සංදේශ කාව්‍යයවල පරිසර වර්ණනා සමකාලීන සමාජ පරිසරය සේ ම ස්වාභාවික

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
ISSN 1800-1459

පරිසරයත් නිරූපණය කරන කැටපතක් බඳු ය. කවියාගේ සුවිශේෂි අවධානයට උද්භිද ගණයා පාත්‍ර වී ඇත්තේ අපූර්වාකාරයෙනි.

බන්නේ මරා මිණි දුළ පබළු මුතු පට
වැන්නේ ගම ඹු ගෙලෙ පල මල් කුමුකු වට
ගන්නේ ත සිත එ බැවින් නො වැදැ කෙළියට
යන්නේ වෙළඳගොඩ දැක මද කලක් සිට
(සැළලිහිණි සංදේශය - 33 වැනි කවිය)

කෝට්ටේ සිට කැළණියට යන සැළලිහිණියාට මඟ ලකුණු විස්තර කරන කවියා, වෙළඳ ගොඩ නම් ප්‍රදේශය අවට පිහිටි පුවක් ගස් පෙළ, ගම නැමැති අඹුවගේ ගෙලවට බැඳි මරකත මැණික්වලින් අලංකාර කරන ලද මාලයක් බව පවසන්නේ රසිකයාට එබඳු ගමක් ගැන චිත්තරූප මැවෙන අයුරිනි. කැළණි ගඟ දෙපස වූ උද්භිත සමූහයා අතර පුවක් ද හිඟ නොවූ බව සැළලිහිණි සංදේශයේ කැලණි ගඟ පිළිබඳ වර්ණනාවල දී පැහැදිලි වේ. (42 වන කවිය බලන්න) සමකාලීන ස්වාභාවික පරිසරයේ පුවක් ගසේ හූ අවකාශීය පැතිරීම සමාජීය වැදගත්කම පිළිබඳ අදහසක් මෙබඳු මූලාශ්‍රයන් මගින් ලද හැකි ය. පරෙවි සංදේශය (112 කවිය බලන්න) කෝකිල සංදේශය (100 වැනි කවිය බලන්න) තිසර සංදේශය (114 කවිය බලන්න) ආදී කාව්‍යවලිනුත් මෙබඳු සාක්ෂ්‍ය සටහන් හඳුනා ගත හැකි ය. එසේම තවත් බොහෝ ගද්‍ය පද්‍ය චිරන්තන සාහිත්‍යයේ පුවක් ගස පිළිබඳ තැබූ සටහන් හඳුනාගෙන තිබේ. (බලන්න උද්භිද නාම ප්‍රදීපිකා, තිස්මඩ නන්දාරාම හිමි, 160 පිටුව: පුවක්)

## පර්යේෂණ ගැටලුව

පුවක් ගස ලාංකේය ජන සමාජය තුළ නියොජනය වන්නේ ශාක විශේෂයක් ලෙස පමණක් නොවේ. එය ලාංකේය සංස්කෘතිය ජන මනස ද නියෝජනය කරන්නේ ය. එය උපයෝගීතාව ඉක්මවා ගිය සංස්කෘතිකමය බැඳීමක් දක්වා පුළුල් පරාසයක විසිරී පැතිරී යනු හඳුනා ගත හැකි ය. මේ නයින් පුවක් ගස හා බැඳි ජන සංස්කෘතියේ යෙදීම් මොනවා ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වශයෙන් හඳුනා ගැනේ.

## පර්යේෂණ අරමුණ

### ප්‍රධාන පර්යේෂණ අරමුණ

- ලාංකේය ජන සංස්කෘතිය තුළ පුවක් ගස හා බැඳි ජන ව්‍යවහාරයන් හඳුනා ගැනීම.

### උප අරමුණු

- පුවක් ගස හා බැඳුණු සුවිශේෂි සමාජ ආර්ථික හා දේශපාලනික භාවිතයන් හඳුනා ගැනීම
- පුවක් ගස හා බැඳි ජනශ්‍රැති එකතු කිරීම හා ඒවා ලේඛන ගත කිරීම

සබරගමුව විශ්වවිද්‍යාලීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
ISSN 1800-1459

- පවුක් ගස හ බැඳි සමාජ සංස්කෘතික සබඳතාවයේ ඉතිහාසය වර්තමානය සහ අනාගත ප්‍රවනතා විමර්ශනශීලීව විමසීම

## පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ ශාක සම්බන්ධ අධ්‍යයන බහුතරයක් කේන්ද්‍රගතවන්නේ ඒවායේ උද්භිත විද්‍යාත්මක කරුණු කෙරෙහි ය. නමුත් යම් භූමි ප්‍රදේශයක ජීවත් වන ප්‍රජාවක් විසින් භාවිතයට ගන්නා ඇසුරු කරන ශාකයක් සැලකිය යුත්තේ හුදු උද්භිද විද්‍යාත්මක ප්‍රපංචක් ලෙස පමණක් නොවේ. මන්ද එය නාම කරණයේ සිට භෞතික හා භෞතිකමය නොවන සමාජ ආර්ථික සංස්කෘතික හා දේශපාලනික උපයෝගීතාවන් දක්වා වන සමාජ මානවවිද්‍යාත්මක පුළුල් පරාසයක විහිදී යන ප්‍රපංචයක් ද වන නිසා ය. මෙබදු පර්යේෂණ ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරිම ගතානුගතික විෂය ශික්ෂණයන් තුළ සිර වී සිදු කළ නොහැකි බව හදුනා ගෙන ඇත. Ethno-Botany (මානව උද්භිද විද්‍යාව ) වැනි විෂයන් බටහිර නිර්මාණය වී ඇත්තේ මෙම අන්තර් විෂය පෝෂණයේ වැදගත්කම අවබෝධකර ගැනීමෙනි. නමුත් අවාසනාවකට ලංකාවේ තවදුරටත් සිදුවන්නේ ඒ ඒ විෂය පථයන් තුළ හා වටා තව තවත් සීමා පනවා ගනිමින් සෙසු සියල්ල අනුචිත නොවැදගත් සහ පහත් ලෙස සළකා බැහැර කිරීමයි.

මෙම ලිපිය උද්භිත විද්‍යාව වැනි ශුද්ධ විද්‍යාවක් සමග ජනශ්‍රැතිය, මානව විද්‍යාව, මානව වංශවේදය, ඉතිහාසය සහ සමාජ විද්‍යාව වැනි සමාජීය විද්‍යාවන් එකිනෙක හා අන්තර් පෝෂණය ලබන අයුරු ඉදිරිපත් කිරීමට උත්සාහ කරයි. මෙවැනි සංදර්භයක් තුළ අන්තර් විෂය පරීක්ෂණයකින් යුතු මෙබදු අධ්‍යයන ශුද්ධ විද්‍යාවන් සේ ම සමාජීය විද්‍යාවේ විෂයන් පෝෂණයෙයහි ලා ද වැදගත් කාර්භාරයක් සිදු කරනු ඇත.

## පර්යේෂණ ක්‍රමවේදය

අධ්‍යයන ප්‍රදේශය නිර්ණය කිරීමේ දී එය විසිරුණු තොරතුරු නියැදියක් ලෙස තෝරා ගැනීමට උත්සාහ ගන්නා ලදි.

වගුව අංක 01 නියැදිය තෝරා ගැනීම

| ප්‍රදේශය | ගම්මාන | එකතුව |
|---|---|---|
| කුරුවිට | පරකඩුව, උඩගම්කන්ද | 02 |
| සිංහරාජය | කුඩව, බූත්කන්ද, පෙතියකන්ද | 03 |
| අකුරැස්ස | දෙදියගල, වැලිකැටිය | 02 |
| රත්නපුර | ගුරුළුවාන, දිවියගල | 02 |
| **එකතුව** | | **09** |

මූලාශ්‍රයඃ- ක්ෂේත්‍රීය විශ්ලේෂණය, 2011

ක්ෂේත්‍රීය අධ්‍යයනය සඳහා මෙසේ විසිරුණු නියැදියක් තෝරාගත්තේ ඒ ඒ ප්‍රදේශවලට සුවිශේෂී වූ ජීවන ව්‍යවහාරයන් හඳුනා ගන්නා අරමුණෙනි. මෙම ප්‍රදේශවලට අමතරව රක්වාන, කලවාන සහ මාතලේ යන ප්‍රදේශවල පුද්ගලයන් කීප දෙනෙකු සම්මුඛ සාකච්ඡා සඳහා දායක කරගත්ත ද එම ප්‍රදේශවල ඍජු නිරීක්ෂණය සිදු කළ නො හැකි විය. ප්‍රාථමික දත්ත, තොරතුරු රැස්කිරීම සඳහා ඉලක්කගත සම්මුඛ සාකච්ඡා විවෘත සම්මුඛ සාකච්ඡා ඍජු නිරීක්ෂණය හා ඡායාරූප ලබා ගැනීම යන ක්‍රම වේදයන් භාවිත කරන ලදි. සම්මුඛ සාකච්ඡාවල දී පටිගත කිරීමේ යන්ත්‍රයක් (Tape Recorder) භාවිත කළ අතර තොරතුරු සංග්‍රහ කිරීමේ දී ද එම විස්තර ඔවුන්ගේ ව්‍යවහාරික බසින් තැබීමට සෑම විට ම උත්සාහ කෙරේ.

ද්විතීයික මූලාශ්‍රය ලෙස ක්ෂේත්‍රය පිළිබඳ ව ලියැවී ඇති ලිපි ලේඛන ඇසුරු කරන ලදි. හැකි සෑම විටම මුල් කෘති පරිශීලනයට උත්සාහ ගත් අතර එය දුෂ්කර වන අවස්ථාවල දී පමණක් ඉන් බැහැර විය. අන්තර්ජාලය ද්විතියික මූලාශ්‍රය පරිශීලනයේ දී ප්‍රතිඵල දායක විය.

## සාකච්ඡාව

### ඵල ප්‍රයෝජන

"කප්රුක" යන්න බෞද්ධ සාහිත්‍යයේ එන මනඃකල්පිත වෘක්ෂයකි. එය දිව්‍යලෝකයේ තිබෙන බවත් නානා විධ සම්පත්වලින් ආඪ්‍යව පවතින බවත් සඳහන් ය. එදිනෙදා ව්‍යවහාරයේ දී අප කප්රුක ලෙස වහරන්නේ "පොල්ගස" පිළිබඳව යි. මන්ද එහි සෑම කොටසක් ම ප්‍රයෝජනයට ගන්නා නිසාත් දෛනික ජීවිතයට අත්‍යවශ්‍ය ව පවතින නිසාත් ය. සාහිත්‍යකරුවන්ගේ අවධානයට පාත්‍ර නො වූව ද ජන දිවිය තුළ පුවක් ගස ද අපගේ අරුතින් කප් රුකක් වන බව තහවුරු වේ. එහි ඵල ප්‍රයෝජන මේ යටතේ සලකා බැලෙයි.

### පුවක් මුල්

පුවක් ගසේ මුල් සහිත පහලම කොටස "පුවක් මුල" නම් වේ. පුවක් තාල වර්ගයට අයත් වෘක්ෂයක් නිසා මුදුන් මුලක් නො පිහිටයි. නොගැඹුරු හා කුඩා විෂසරියක පුවක් මුල් ව්‍යාප්ත වේ. එළිතින් ඇදී එන ලා පුවක් මුල් දත් රෝග හා මුඛ රෝග සඳහා ප්‍රතිකාරයක් ලෙස තම්බා කට සේදීමට ගනී (පියදාස, 2010.12.20). ඇතැම් ප්‍රදේශවල කජු පොතු ද ඊට එක් කරයි. එය දත් කැක්කුමට අත්දුටු ඖෂධයකි (ගුරුසිංහ, 2011.01.09). කිතුල් රාවලට ඉඑක් මුල් හා පුවක් මුල් තලා දමන්නේ රා පැසීම සඳහායි. නැතිනම් එහි සැර වැඩි කිරීමටයි (ජයරත්න, 2011.01.10).

### පුවක් කඳ

පුවක් මුලෙන් ඉහළ සිට කරටිය දක්වා වූ කොටස පුවක් කඳට අයත් ය. එය අඩි 33-66 අතර උසකට විහි දේ. වට ප්‍රමාණය අඟල් 10ක සිට 18ක් පමණ විය හැකි ය. 'මෝරුච්චි ගස් වල, මුල ඉඳන් අඩි තුනක හතරක කුට්ටියක් කපල අයින්

කරනවා. එක පලන්ඩ හෙම බෑ අමාරුයි. ඒකට කියන්නේ "වැලි පොල්ල" කියල. ඔය ඉස්සොරෝම පරණ ගෙවල්වල රීප්ප වලට දුම්මේ "පුවක් පටි" හෝදට සුද්ද කරල. වේලෙන්ඩ වේලෙන්ඩ හයිය හොඳා,,. මැටි ගෙවල් වල වරිච්චි බදින කොට හරස් පටි වලටත් ගන්නේ පුවක් පටි" (පියදාස, 2010.12.20). පුවක් කඳ දෙකට පැළු විට පුවක් පළුවකි. එවැනි පුවක් පළුවක් බඩය ඉවත් කර සුද්ද කර වැහි පීලි ලෙස භාවිත කරන අයුරු ද දැකි ය හැකිය. වෙසක් පොසොන් කාලයේ බහුල ව දක්නට ඇති දෙයකි තොරණ බැඳීම. කොපමණ තාක්ෂණය දියුණුව පැවතියක් අද තොරණ උසුලා ගෙන සිටින ආධාරක වන්නේ පුවක් කොට ය. මේ කාලවල දී ගම්වල පහන් වැටවල් තැනීමට උපකාරවන්නේ ද පුවක් පටි සහ පුවක් කොටයි. 'පුවක් ගහ පලන කොට අයින් කරන ලද බඩේ තියෙනව නේද ඒ දෙනව හරකුන්ට කන්න. හැබැයි පරණ වුනහම බෑ ,,. රොක්කරල තිබ්බොත් හොඳ පෝරක් (සෝමාවතී, 2011.12.20). පුවක් "පළුව" නැවත තීරු වලට පැළු විට එය පුවක් "පටියකි". නැතහොත් "ඉරුවකි" වැටවල් බැඳීමට බුලත් හෝ එවැනි වැල් බෝග වල පන්දලම් සැකසීමටත් පුවක් පටි අත්‍යවශ්‍ය වේ.

පතල් කර්මාන්තයේ දී පුවක් පටි නැතිවම බැරි ය. පතලේ දී ඒවා "පතල් ඉනි" ය. එහි උපයෝගීතාවය අනුව පතල් කර්මාන්තයේ දී ඒවාට විවිධ නම් යෙදී තිබේ. '"වහල් පටි" කියන්නේ දෝනා පතල් වල දෝනාවේ වහලින් මඩ වතුර ගලන එක නතර කරන්න කොල අතු එක්ක අල්ලන පුවක් පටි වලට. මේ කොළ අතුවලට පුවක් පටිත් ගන්නවා. ඒත් කැකිල්ල විතර හරියන් නෑ..... "ඇලපත් කිරි" කියන්නේ දෝනාවේ බිත්ති වලට අතු අල්ලන පුවක් පටි. "ඉටිපන්දම් කිරි" කියන්නේ ඉටිපන්දම් ගහල තියන්න හදපු පුවක් පටියකුට, තව තියෙනවා ඉතිං "මූණත් කිරි" හෙම කියලා (දයාවංශ, 2010.12.30). මෙහි "කිරි" යන යෙදුම පුවක් පටි වල බාහිර ස්වරූපය නිසා යෙදුන කැයි අනුමාන කළ හැකි ය. පතල් වාඩියට සේම එහි මැස්සට ද පුවක් පටි අත්‍යවශ්‍ය වේ.

අළුත් අවුරුදු කාලයට විවිධ ජන ක්‍රීඩා සඳහා පුවක් කඳ විවිධාකාරයෙන් ප්‍රයෝජනයට ගනී. "ලිස්සන ගහ" ඉන් වඩා ප්‍රචලිත ක්‍රීඩාවයි. ලිස්සන ගහ සඳහා කපා රැගෙන එන පුවක් ගසේ කඳ පෙරන්ගා සුද්ද කර ගනී. ඇතැම් විට සියුම් දාර පවා මැකී යන පරිදි බෝතල් කටුවලින් පෙරන් ගෑම ද සිදු කරයි. ඉන් පසු ලිස්සන ගස සිටුවා මුදුනේ කොඩියක් සවිකර කඳ පුරා ග්‍රීස් තවරනු ලැබේ. (මේ නිසා ග්‍රීස් ගහ කියා ද ව්‍යවහාර කෙරේ.) ජයග්‍රහණය පිණිස තරඟකරුවන් මහත් ආයාසයකින් මුදුනේ කොඩිය වෙත නැගිය යුතු ය. අවුරුදු ක්‍රීඩා අතරට ගැනෙන කොට්ටපොර සඳහා කතිර බැඳීමටත් හරස් කොටය (පෙර කොටස) සඳහා ගනු ලබන්නේ ද පුවක් කොටයකි. "සෙක්කුව" අවුරුදු කාලයේ දී පමණක් නොව සෑම කාලයකදී ම ගැමි දරුවන්ට විනෝදය සැපයූ ක්‍රීඩාවකි. පොළොවේ ලී උලක් සිටුවා අඩි 6ක් පමණ දිග පුවක් කොටයක් ගෙන එහි හරි මැදින් සිදුරක් සාදනු ලැබේ. පොළොවේ සිටුවනු ලැබූ ලී දඬු පුවක් කොටයේ කැපූ කත්තුවට රිංගවනු ලැබේ. පුවක් කොටයේ දෙකෙළවර කත්තු දෙකක් කපා උඩට මතුවන ලෙස ලී දෙකක් සවිකරන්නේ සෙක්කු පදින්නාට අල්ලා ගන්නටයි. සෙක්කු පදින්නන් මෙහි දෙකෙලවර වාඩි වී කකුලෙන් වාරුගෙන උස්වෙමින් පහත් වෙමින් හා කැරකෙමින් සෙක්කු පදිනු ලැබේ. 'අවුරුදු කාලෙට හදන කතුරු උන්චිල්ලාව සම්පූර්ණ ම පුවක් ගහෙන් තමා හදන්නේ. ඉඳගන්න ලෑලියි,

සරසන හොක් අතුයි. බදින ඒවායි ඇරුනම් සම්පූර්ණ පුවක් ගහෙන් තමා කතුරු උන්විල්ලාව හදන්නේ. මෙකේ වේගේ ගන්නේ පොලු පැතලා දෙක, තුන, හතර, පහ කියලා. පහ කියන්නේ හරි වේගයි (පියදාස, 2010.12.20). කොකිස් පිසීමට ගන්නා "කොකිස් කූර" පුවක් ලී පතුරක් උල්කර සාදා ගන්නකි. එසේම පොල්කටු හැඳිවල මිටවල් සඳහා යොදා ගන්නේ ද හොඳින් පෙරන්හා සකසන ලද පුවක් ලී පතුරකි.

> "ඉස්සොරෝම මෙහෙ ඉදන් (සිංහරාජයේ සිට) මානානට හකුරු අරං ගියේ කත්වල. ඒකේ කදට ගත්තේ පුවක් පටියක්. ඉස්සර මඟුල් පෙරහැරේ කද අරං ගියෙත් පුවක් ලියක දෙකොනේ එල්ල ගෙන තේ" (ලැයිස, 2010.12.30).

ඇළ දොල බහුල තෙත් කලාපයේ ඒවායින් වැයකර වීම සඳහා යොදාගත් "ඒ දණ්ඩ" බූයේ ජල පහර හරහා දමන ලද පුවක් කදක් හෝ දෙකකි. ලා පුවක් ගසක් (පැලයක්) අතු පිටින් කද මැද්දෙන් කපලා අරගෙන පිරිත් මණ්ඩප්පේ එක මුල්ලකින් තියෙනවා. ඒකට කියන්නේ "රාජගහ" කියලා. පුවක් අතු මණ්ඩපයේ පුරා වියනක් විධියට අරිනව. ඒක මේ පැත්තේ පිරිත් ගෙවල්වල තියෙන එකක්. සමහර පැතිවල දී මම ඒක දැකල නෑ" (ගුණරත්න, 2010.12.30). මේ වන විටත් අමතරව ගැමියට මඟුල් ගෙවල් අවස්ථාවල දී විවිධ සැරසිලි කිරීම් සඳහා පුවක් ලී නැතිවම බැරිය.

බොහෝ පන්සල්වල අපාය සිතුවම් කිරීමේ දී හෝ ඇඹීමේ දී එහි එක දඬුවම් ක්‍රමයක් ලෙස; ලංව පිහිටි පුවක් ගස් දෙකක් ලංකර නවා වරදකරුගේ එක් පයක් එක් ගසකත් අනෙක් පය අනෙක් ගස්සත් බඳී. පසුව පුවක් ගස් ලංකර ඇති බැමි කපා දැමේ. ඒ සැනින් පුවක් ගස් දෙපසට ඈත් වන්නේ වරදකරු ද පළු දෙකකට ඉරා දමමිණි. ඒ අනුව අපායේ කටු ඉඹුලට පසුව ඇති එකම ගස පුවක් වන බව පෙනේ.

## අතු සහ කොළ

පුවක් ගසේ තිබෙන අතු පුවක් අතු ය. නැතිනම් එය ඉදී වැටුන විට "ඉරට අතුය". එය පුවක් කදට සවි වී ඇත්තේ කොළපතෙනි. පුවක් උත්තේ "පිත්ත, පිල්ල" නොහොත් නාරටිය දෙපසින් විහිදී ඇත්තේ පුවක් කොළ ය. ඉරටු ඇත්තේ පුවක් කොළයේ ය. "අපි ඉතිං කියනවා කොළපතක් වැටුනම පුවක් ගහ අඟල් හතරකින් උස ගියා කියලා. එහෙම කියන්නේ..... ඇයි...... කොළපතක් වැටුනම හරියටම අඟල් හතරකින් වැටෙන්නේ. හැම පුවක් අත්තකම හැදෙන්නේ අඟල් හතරට" (ජයසේන, 2010.12.20). පුවක් අත්තෙන් වෙන්කර ගන්නා ඉරටු මිටියක් කොට බැඳ ගැනීමෙන් ඉලපත සාදා ගනී. එය ගැමි ගෙදරවල ඇතුලත අතුගෑම සඳහා ය. පොල් ඉරටුමෙන් මෙහි කෙරුවලවල් කියුණු නොවන නිසා ගෙබිම හැමී නොය යි. ඉලපත ගෙවී ඉරටු වල තද කොටස මතු වූ විට එය "කටු ඉලපත"කි. එවිට එය යෝග්‍යය වන්නේ මිදුල් අතුගෑම සඳහා ය. ඉරටු ඉවත් කරගත් පුවක් අත්ත බුලත් වැනි බෝග සඳහා වසුනක් ලෙස යොදනු ලැබේ. එය බුලත් කොරටු සඳහා හොඳ පෝරකි. වැටුණු පුවක් අතු බුලත් වගාවේ පැති ආවරණ සඳහා යොදා ගනී, වැල්බෝග සඳහා ආධාරකයක් ද වේ. වළං බෑම (තැබීම) සඳහා ගන්නා දරණු ගොතා ගන්නේ ද ඉදී වැටුණු පුවක් කොළ එකට

තබා ගොතා ගැනීමෙනි. "ඉස්සර පෙරහැරවල පන්සල් වල සවරන් ගැහිලි වලට ගන්නේ වෙළිච්ච පුවක් කොල. ඉරටු අයිං කරලා තීරු වලට ඉරලා සායම් ගාල හෙම කරලා. දැන් ඉතිං වෙසක් කොලේනේ ගන්නේ" (පියදාස, 2010.12.20). පොල්, පුවක් ගස් නැගීම සඳහා ගැමියාට වළල්ලක් අවශ්‍ය වේ. ගස් නැගීමේ ආධුනිකයෙකුට නම් මෙය නැතිවම බැරිය. හදිසියක දී මේ සඳහා පුවක් පැලයක ලා අත්තක් කපා එය අඹරා ගැටගසා ගැනීමෙන් ගස් යාම සඳහා වළල්ලක් සාදා ගැනීම ගැමියාට නුපුරුදු කාර්යයක් නොවේ. ගැමි ගෙදරක මරණයක් සිදු වූ විට මළගෙදරට යන මඟ දැන්වීම සඳහා ත් සැරසීමක් වශයෙනුත් මඟ දෙපස අමු පුවක් අගිසි හිටුවා එයට හුණු දියකර ඉසිනු ලැබේ. රත්නපුර, කුරුවිට හා පරකඩුව ආදී ප්‍රදේශ වල දෙමළ වතු කම්කරු අවමඟුල් වලදී සන්නිවේදන සංකේතයක් ලෙස මෙය සුලභව ම යෙදේ. "දළු මඩු, දර මඩු වගේ ඒවා සෙවිල්ලන්න පුවක් අතු ගන්නවා. ඉරු කරලත් ගන්නවා. නැතුවත් ගන්නවා. අත්ත බදින්නෙත් පුවක් කොලෙන්මයි, ගෙවල් හෙවිල්ලන්ඩ නම් ගන්නේ නැතුව ද කොහේද?" (ගුණරත්න, 2010.12.30).

### කොළපත

පුවක් අත්ත පුවක් ගසේ කඳ සමඟ බද්ධ ව පවතින්නේ කොළපතකනි. පුවක් අත්ත ඉදී වැටෙනුයේ කොළපත ද සමඟිනි. "කොළපත් වැටෙන්නේ අවුරුද්දකට සැරයයි කියලා තමා කියන්නේ, නවම් මහට තමා කොළපත් වැටෙන්නේ එක ගහකින් කොළපත් හතක් වැටෙනවා මේ කාලෙට" (සිරිසේන, 2010.12.30). වසර පුරා කොළපත් වැටීම සිදුවන බව නිරීක්ෂණය කළ හැකි මුත් නවම් මස සුවිශේෂී කාලයක් ලෙස හඳුනා ගන්නා බව පෙනේ. "දැන් අයනේ ගණන් ගන් නැත්තේ, ඉස්සර ගෑණු කට්ටිය ලොකු කොළපත් දැක්කොත් ඒක කපලා දුමට ගෙනත් දානවා. ඒක හරි ප්‍රයෝජන වෙනවා" (පියදාස, 2010.12.20). ගැමියාට කොළපත ආකාර කීපයකට ප්‍රයෝජනවත් ය. ඒ සඳහා ප්‍රයෝජනවත් ආකාරයට කොළපත සකසා ගත යුතු ය. එසේ සකසා ගැනීමට පෙර එය ''දඬු කොලපතකි'' මෙය සකස් කරගන්නේ පළමුව කොළපත දෙපැත්තෙන් කපා දමා එහි මුලින් තියුණු පිහිතුඩක් තබා ඉරු වශයෙන් කොළපතේ පිට පොත්ත ඉවත් කළ යුතු ය. ඉන් පසු අව්වේ දමා වේලා ප්‍රයෝජනයට ගනු පිණිස දුමේ තැන්පත් කරයි. එවිට ඒවා කටු කොළපත් වේ. "කොළපතේ තමයි කොහාට ගියත් බත්මුල්, කෑම ජාති, හොදි ජාති හැම දෙයක් ම අරං ගියේ, ඔය කුඹුරු වැඩ කාලෙට හෙම පාවිච්චි කරලා ආයෙත් වේලලා ගත්තම තව මාසයක් විතර ඉතිං එක කොළපතක් තියාගන්න පුළුවන්. කෑමත් රස්නෙ යි, රහයි කොළ පතේ බැන්දම" (ජයසේන, 2010.12.20). කොළපත සුද්ද කිරීමේ දී ඉවත දමන කොළපතේ පිටි පොත්ත වතුරේ දමා පොඟවා බුලත් කඩික බැඳීමට ගනි. ඇතැමුන් ඒවා කීපයක් එකට අඹරා වලං තැබීමට දරනු ගොතයි. මෙසේ සකසා ගත් කොළපත් බත්මුල් බැඳීමට මෙන්ම ආහාර පිළියෙළ කිරීමේ දී ඒවා තැබීමට, බැඳීමට හා කල්තබා ගැනීම සඳහා උපකාරී වේ. "දොදොල් හැඳි ගා එය සකසා ගත් කොළපතක දමා රෝල්කර දෙකෙලවර ගැටගසා එල්ලා තැබේ. එය ''දොදොල් පට්ටයකි'' (කල්‍යාණවති, 2011.01.04).

කිතුල් මල් කැපීමේ දී කොළපත බොහෝ ප්‍රයෝජනවත් ය. කිතුල් මල තළා බෙහෙත් ගල්වා එය වෙළනු ලබන්නේ කොළපතක් මල වටා එතීමෙනි. එහි දී

කොළපතේ පිටි පැත්ත ඉවත් කරන්නේ නැත. මලින් තෙලිප්ප වැස්සෙද් දි එය එකතු වන්නට එල්ලන්නේ කොළපතකින් තැනූ ගොටුවකි. එය කොළපත් ගොටුව යි. 'මෙය සකස්කර ගන්නේ කොළපතේ අගමුල කපා දෙකොන හැඩකර ගැටගසා හතරැස්කොට ගැනීමෙනි. එය එල්ල ගෙන යා හැකි පරිදි කුකුළු වැල් දෙපොටක් දමා සකස් කර ගනී. මෙම ගොටුව බීමට වතුර ගෙන යාමටත් ගොයම් සාත්තු කිරීමේ දී ''කිරි ගොටුව'' සෑදීම සඳහාත් තොවිලයක දි ''දුම්මල ගොටුව'' ටත් භාවිත කරයි. කිරි ගොටුව යනු දළුක් කිරි, දුම්මල තෙල්, ආදිය යොදා සකස් කර ගන්නා භාජනයයි. දුම්මල ගොටුව යනු දුම්මල පිටිකර තබා ගන්නා භාජනය යි. කට්ටඩියා එයට අත දමා අඟුරක් ගෙන පන්දමට ගසනු ලැබේ. දුම්මල ගොටුව අල්ලන්නේ කොට්ටෝරුවා විසිනි. ''ගැමි ගෙදරක එක් තැන් වූ රෝගියෙක් වී නම් ඔහුගේ හෝ ඇයගේ වැසිකිලි බඳුන ද එම ගොටුවකි'' (කල්‍යාණවති, 2011.01.04). කිතුල ට ගොඩවන ගැමියාට තම ''මල් පිහිය'' ආරක්ෂිතව ගසට රැගෙන යාම අවශ්‍යය. එය ඉතා තියුණු මුහුණතකින් යුතු බැවිණි. මෙය බහාලීම සඳහා කොපුව සකස් කරගන්නේ කොළපතකිනි. මෙය දෙආකාරයකට සකසා ගනී. පළමු ආකාරය නම් පිහිතලයේ ප්‍රමාණයට කොළපතින් කොටසක් කපාගෙන, එය පිහිය වටා ඔතා ඉතිරි වන කෙලවර එකක් යට ටිකක් රිංගවයි. ඉහළ කොළපත් කොටස ද පහලට නමා යටට රිංගවයි. යටි කොළපත් කෙලවර පිහිතලයේ අඟින් කපා ඉවත් කරයි. දෙවන ක්‍රමයේ දී පෙර ආකාරයට ම ඔතා අනවශ්‍ය කොටස් ඉවත් කර වේවැලකින් කොපුව වටා වෙළුමක් දමයි. මෙහිදී කොළපත් කොටසකින්ම පිහිය පිටතට ඇදීම වැලැක්වීම සඳහා අගුලක් ද සකසනු ලැබේ. මේ ආකාර දෙකේ දීම කොළපත සුද්ද කිරීමක් නොකෙරේ. කිතුල් පැණි සකසා ගන්නා ගැමියාට එය කල්තබා ගැනීම සඳහා උපකාරී වූයේ කොළපත ය. සුද්ද කර අටුවේ දමාගත් කොළපත දෙකට නවා දෙකෙලවරවල් රවුම් කර නැමූ පසු ඉහළ කෙලවර පමණක් විවෘතව පවතී. එයට උණු කරගත් කිතුල් පැණි වත්කර කට වැල්පටකින් තදින් ගැටගසා දුමේ එල්ලා තැබේ. ඒවා ''පැණි මුල් ය''. ''පැණි මුලක් අවුරුද්දක් හමාරක් වුනත් තියාගත හැකි ය. හැබැයි දුම් වදින්න ඕනෑ. පැණි උණු කරන කොට ''තෙල් දිය දුම'' වැදුනම කාලෙකට පස්සේ මේක වැලි හකුරු වෙනවා. ඒ කියන්නේ සීනි කැට වගේ හැදෙනවා. දැන් ඒවා නෑ. පැණි මුලුත් නැතේ'' (ගුණරත්න, 2010.12.30).

බෙසම්, මැටි කොප්ප හිඟ වූ අතීතයේ දරුවන් නෑවීම සඳහා ද කොළපත් ගොටු යොදාගෙන තිබේ. ඒ සඳහා විශාල කොළපත් අවැසි ය. ඒවා දඬු කොළපත් ය. එය කුල්ලක් ආකාරයට එක් කොනක් හැඩකර නවා සකස් කර ගැනේ. එහි වටේට වෙට්ටමක් බැඳගනු ලැබේ. මෙයට ජලය පිර වූ විට, එක් කොනක් (හැඩකර නමාගත් කොටස) ගැඹුරු වන අතර අනෙක් කොටස නොගැඹුරු යි. ''මාස තුනක් විතර මේකේ ළමයා නාවන්න පුළුවන්, කොළපතේ ''රිවිඩිල්ලාව'' හන්ද වතුර කොළපතට උරා ගන්නේ නෑ. වේලා වේලා ගන්න පුලුවන්'' (ලැයිසා, 2010.12.30 ). ''මගේ ළමයි පස් දෙනාම නෑව්වේ කොළපතේ, ඉන්දෙව්වාම ඔහේ තල තලා ඉන්නවා'' (ජේන්, 2011.01.11).

> 'කොළපත් ගොටු සකස් කරගන්නා තවත් ආකාරයක් තිබේ. එහිදී කොළපතේ දෙකොන කපා දෙකට නමයි. දෙපැත්තේ දෙකෙලවර වල් එකට ළං වී සිටී. ඒ දිගට දෙපැත්තම පට්ටයකින් මසනු ලැබේ.

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
ISSN 1800-1459


මසා ඉතිරි වන පට්ටා දෙකෙලවර ඉහළින් ගැටගැසීමෙන් එල්ලාගෙන යා හැකි මල්ලක් සෑදේ. කොළපතේ අග හා මුල දෙකොන මල්ලේ කටය. එය යම් යම් දෑ දමාගෙන කුඹුරට යාමටත් බීජ ඇට වර්ග දුමේ එල්ලා තැබීමටත් උචිතය'' (කළ්‍යාණවති, 2011.01.04).

“වේළුණු කොළපතක් අරං ඒක රෝල් කරල වටේට කැකුණ ඉටි තවරලා පට්ටාවකින් වෙලා ගත්තම ඒක හොඳ පන්දමක්. කාලයක් පත්තු කරන්න පුළුවන්.ඒවා තමයි ඉස්සර පාවිච්චි කලේ.දැන් වගේ බැටරි තිබුණයැ ඒ කාලේ” (රොසලින්, 2010.12.29).

ගසින් වැටෙන ''දඬු කොළපත'' ගැමි දරුවන්ට ආකාර කීපයකින් විනෝදය සැපයී ය. පළමු වැන්න නම්, කොළපත් පැදීමෙනි. වැටුනු කොළපතේ පුවක් කොල ගලවා දමා, කොළපතේ අයෙකු වාඩි කරවයි. වාඩි වන්නාට කොළපතේ හිස අල්ලා ගන්නට පුළුවන. අනෙකා කොළපතේ නටුවෙන් ඇදගෙන යයි. කොළපත ගෙවීයන තෙක් කොළපත් පැදීම සිදුකල හැකි ය. හැංගිමුත්තං කෙළිම හා හොරා පොලිස් සෙල්ලමේ දී කොළපත් වෙස් මුහුණු කපා ගැනීමට හැකි වීම කොළපතින් ගැමි දරුවන් ලැබූ තවත් ප්‍රයෝජනයකි.



කොළපත සුද්ද කිරීම




පැණිමුල


පූරාණයේ ගෙපල් ඇදීමේ දී පස් ගෙනයාම සඳහා කොළපත් භාවිත කර තිබේ. 'උතුරු වැද්දාගල තියෙනවා'' කිරාවැව'' කියලා පොඩි වැවක්. දැන්නම් ඒක ආණ්ඩුවෙන් ගොඩ කරලා විනාස කරලා, මේක හදලා තියෙන්නේ කිරා කියලා මනුස්සයෙක්. මිනිහා වැව් බැම්ම හදන්න පස් ගෙනත් තියෙන්නේ කොළපතේ ඇදගෙන කියලා කතාවක් තියෙනවා'' (විමල් ශාන්ත, 2010.12.29). ගැමි ගෙවල ආහාර ගැනීම සඳහා ද කොළපත් භාවිත කර තිබේ. ඒවා ''කොළපත් පිඟන්'' වේ. දඬු කොළපතක් ගෙන එය රවුමට කපා වේලා වංගෙඩි කටේ සිරකර තැබේ. එවිට එය ගැඹුරට වටකුරුව සකස් වේ. කුඹුරුවල ''කයිය'' බෙදීමට කොළපත් පිඟාන් සුලභව භාවිත වී ඇත. ගැමි ගෙදරක 'කලය' තැබුවේ

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිට 49-79
ISSN 1800-1459

කොළපතක් මිනය. ගොම, මැටි පිළියම් කිරීමට රැගෙන ආවේ කොළපතකයි. කොස් ගෙඩියක් කඩාගත් පසුව වුව ද එය කොහොල්ලෑ බේරීම වලකමින් රැගෙන ආවේ කොළපතක ය. කොසය සුද්ද කර ගැනීමට ද කොළපත උපකාරී විය. ගැමි ගෙදරවල හැඳි එල්ලා තබන ''හැඳි අල'' කපා ගත්තේ ද කොළපතකිනි. උළු සෙවිලි කළ වහල වළ වැසි සමයේ වැසි වතුර කාන්දු වීම සුලභය. එහිදී කොළපතක් කපා උළු කැටයට යටින් රිංගවීම දැලබ අත්දැකීමක් නොවේ. ''ඉස්සර හේන් කරන කාලේ, හේනට සත්තු එනවට නියරේ කෝටියක් හිටෝලා කොළපතක් කපලා අරං දෙකට නමලා ඔකේ රඳෝනවා. ඒක හුළඟට වැනෙන කොට සත්තු බයයි එන්නේ නෑ'' (ලැයිසා, 2010.12.30).

''ග්‍රහ අපල හෙම තියෙන කොට වී ටිකක් කොළපොතක මුලක් වෙන්න ගැට ගහලා, ඕකට ම පඬුරුත් දාලා ගෙයි පේන තැනක එල්ලල තියෙනවා. ඒක කතරගම දෙයියන්ට වෙන බාරයක්. විෂ්ණු දෙයියන්ටත් මේ විදියට බාර වෙනවා. පෙරහැර කාලෙට ඒ වී මුල අරන් ගිහින් පඬුරුයි වී යි දේවාලෙට පූජා කරලා බාරෙ ඔප්පු කරනවා'' (ජේන්, 2011.01.11). දඬු කොළපොත දෙකෙළවර ගැට ගසා එය හිස් වැස්මක් ලෙස භාවිත කරන අවස්ථා ද තිබේ. පතල් කර්මාන්තයේ දී හා ගොවිතැනේ දී මෙය සුලභ ය. වැලි ගොඩ දමන්නන් මෙය යොදා ගන්නේ වැලි කුඩ හිස මත තබාගෙන යාම සඳහා යි.



පිහි කොපුව, කොළපත් පිඟාන සහ ගොටුව


කොළපත් තැම්පත් කර තබන අටුව

මී මැසි පාලනය ව්‍යාපාරයක් නොවූවත් ගම්වල වඩාත් ප්‍රචලිත ය. ගමන් කරන මී මැසි රංචු ගමන් මැහි පොදි වේ. ගෙවත්තේ සකසා ඇති මී කොට (කිතුල් කොටයක බඩය සුද්ද කර එහි දෙපැත්තෙහි කුඩා සිදුරු කීපයක් පමණක් තබා මැටිගසා වසා උස් ගස් මුදුන්වල මී මැස්සන් එනු පිණිස රඳවා තැබෙන්නකි ) වලට ගමන් මැහි පොදියක පැමිණීම ස්වභාවිකව ම සිදු නොවූ විට ගැමියා ඔවුන් උපායශීලීව අල්ලා එහි ගෙනත් දමයි. ඒ සඳහා ඔහුට උපකාර වන්නේ කොළපතකු ත් අමු කොළ අත්තකුත් රිටකුත් මී පැණි ස්වල්පයකුත් පමණි. කිරි ගොටුවක් ආකාරයෙන් කොළපත නවා එහි මධ්‍යයේ මී පැණි තැවරූ අමු අත්ත එල්ලයි. පසුව එම කොළපත් ගොටුව රිටි අග කෙක්කක් මෙන් ගැටගසා එම ගොටුව රිට ආධාර කරගෙන මැහි පොදිය සමීපයේ තැබේ. ටික වේලාවකට පසු එම ගොටුව තුළට මැහි පොදිය ඇදී එන අතර පසුව පුරුදු කරුවෙකු මී මැසි පෙට්ටියක මී මැසි ජනපදය සිර කරනු ලැබේ. එහි ඇති සිදුරෙන් මී මැසි රැජිනට පලා යා නොහැකි නිසා සෙසු මැස්සන්ට ද එහි රැඳී සිටීමට සිදුවේ.

ISSN 1800-1459

දැන් දැන් කොළපත විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය සඳහා ඉතා වැදගත් අමු ද්‍රව්‍යයක් ව තිබේ. තාක්ෂණික ක්‍රම භාවිත කරමින් මල්, පිඟන්, බන්දේසි, දීසි, හෙප්පු ආදිය නිෂ්පාදනය කෙරෙන අතර දෙස් විදෙස් වශයෙන් මේවාට ඉහළ ඉල්ලුමක් තිබේ.



කොළපත් හා පුවක් ගසේ අමුද්‍රව්‍ය මඟින් සැකසූ මල්

## පුවක් මල

'"පුවක් මල" හට ගන්නේ පුවක් ගසේ අතු වලල්ලට පහලිනි. එය කොළපතකින් ආවරණය වී තිබේ. කොළපත ඉදී වැටුණු පසු ඇත් දළ පැහැති පුවක් මල දැකිය හැකිය. එය මල් පිහාටුව කී. නැතහොත් මල් පතුර කී (ජයසේන, 2010.12.20). "පුවක් මලේ ඉති කිණිති තවත් කොපුවකින් ආවරණය වී ඇත. එම ආවරණය පිල්ල කී. නැතහොත් බබා කොළය කී" (ගරුසිංහ, 2011.01.10). "මල මෝරා වැඩෙත්ම එය ඉරී ගස මුල වැටේ. එය හැවඩිල්ලාව, සැවඩිල්ලාව නොහොත් රැවඩිල්ලාව කී" (රාජපක්ෂ, 2010.12.10). දැන් පුවක් මලේ ඉති හා කිණිති පැහැදිලිව දැකිය හැකි ය. මල් කිණිත්තක් යනු පුවක් මල බෙදී ඇති ඉති ගණනාවකින් එකකි. එම සියලුම කිණිති ඉති හා සම්බන්ධ ය. මේ කිණිති වල කුඩා පුවක් මල් දහස් ගණනක් තිබේ. ඒවා දෙවර්ගය කී. එනම් ගැහැණු මල් හා පිරිමි මල් ලෙස යි. පුවක් ගෙඩි හටගන්නේ ස්ත්‍රී මල් වල යි. ඒ සඳහා පිරමි මල් තිබීම අත්‍යවශ්‍ය ය. ස්ත්‍රී මල ප්‍රමාණයෙන් ලොකු ය. ඒවා ලැටි ලෙස ද හැඳින්වේ. පිරිමි මල් පරාගණයෙන් පසු ගස මුල වැටී යයි. මී මැස්සෝ බහුල වශයෙන් පුවක් මලේ මත්වන සුවඳ විසින් ආකර්ෂණය කෙරේ. පරාගණය සිදුවන්නේ එවැනි කෘමීන් හරහා ය. පුවක් මල් සුවඳ රාගික සුවඳ කැයි ගැමියෝ විශ්වාස කරති. "පුවක් මල් කුමාරි" යනු ලංකාවේ පැරණි ළමා කතාවක එන කුමාරිකාවකි. කාරුණික ඇය පුවක් ගසක වාසය කළ බව කියැවේ. (බලන්න. "පුවක් මල් කුමාරි" සුනන්ද මහේන්ද්‍ර, 1995).

"ආගමික හා තොවිල් පවිල් කටයුතුවලදී පුවක් මලට සුවිශේෂී වැදගත්කමක් හිමි වේ. පුවක් මල් බුදුන්ට පූජා කළ විට වැඩියෙන් පින් ලැබෙන බවත් මිටි අයවලුන් පුවක් මල් පූජා කිරීමෙන් ලබන ආත්මයේදී උස යන බවටත් ගැමියෝ විශ්වාස කරති. පුවක් මල් කිණිති පිරිත් මණ්ඩපයේ වියනේ එල්ලීමටත් පිරිත් නූල් එතීමටත් අවශ්‍යය වේ. තොවිල් පවිල්, කප් සිටුවීම්, සෙත් ශාන්ති කිරීම්

වලදී ආශිර්වාද කිරීමටත් පිරිත් පැන් ඉසීමටත් පුවක් මල් කිණිති නැතිවම බැරි ය. අලුත් අවුරුද්දට රත්නපුර මහ සමන් දේවාලයේ අලි ඇතුන්ගේ හිස තෙල් ගාන්නේ පුවක් මලකිනි. මිනිසුන්ගේ නම් පුවක් කිණිත්තකින් එම කාරිය ඉටු කළ හැකි ය. වන්දනා ගමනක් යන විට වාහනයේ ඉදිරිපස පුවක් මලක් ගසනු ලැබේ. එය වාහනය තුළ සිටින නඩය වන්දනාවේ යන බවට සංකේතයකි. පුවක් මල පිල්ලෙන් එළියට ඒමට පෙරදී එය බත්මල නම් වේ. එහි අරුත නම් පුවක් මල බත් මෙන් අතින් පොඩි කල හැකි බවයි. මෙම මල තලා කහත් සමග කොටා මලවා උලුක්කුවට පත්තු බඳී. පත්තුව ශරීරය මත තබා ගැනීමට පෙර ඒ මත බබා කොලය තබනු ලැබේ" (ගරුසිංහ, 2011.01.10). "වගා ආරක්ෂාවට කෙං කරන කොට නා දලුයි බුලත් දලුයි ගොක් කොළයි පුවක් මල් කිණිත්තකුයි එකතු කරලා රිටක බැඳලා ඒක කුඹුරෙ හතර කොනේ ගහනවා" (සෝමදාස, 2010.10.20). "කුඹුරුවල අස්වැන්න වැඩි කිරීමට කරන පුර වැඩීමේ දී මල් පැලට පුවක් මල් කිණිති අවශ්‍යය වේ" (කුලරත්න, 2011.01.11). "බබා කොළය සියුම් ලෙස ඉරා එය බුලත් කඩික (නව වගාවක් සඳහා සිටුවන ලබන බුලත් අගිසි) හා පලා මිටි බැඳීමට යෝග්‍යය වේ" (ගරුසිංහ, 2011.01.10).

## පුවක් ගෙඩි

පුවක් මල් ලැටිවලින් පුවක් ගෙඩි හට ගනී. ලැටි තරමක් වැඩුණු විට ඒවා පැන්තුරු වේ. මේවා අතින් මිරිකා දමන්නට පුළුවන. ඉන්පසු අවස්ථාව නිලෝටු නම් වේ. ගෙඩි තද කොළ පැහැයක් පෙන්වන අතර ඒවා පැසුණු පුවක් නොවේ. නිලෝටුවල වර්ධනීය අවස්ථාව ගොලෑං නොහොත් ගොලෑ පුවක් ය. මේවා පැසුණේ වුව ද ඉදී නැත. රබ්බඩ පුවක් යනු ඉදුණු පුවක් ය. ඒ ගොලෑවලට පසු අවස්ථාව වෙයි. රබ්බඩ පුවක් ගස් යට ඉඳී වැටේ. වවුලෝ ඉදුණු පුවක්වල යුෂ උරා බී තැන තැන දමා යති. ඒවා වවුල් පුවක් ය. පුවක් හට ගන්නේ පුවක්වල්ලේ ය. නැතහොත් එය පුවක් තැරියකි. පුවක්වල්ල පුවක් මල සේම ඉති සේම ඉති හා කිනිති ලෙස බෙදී ඇත. කිනිත්ත කුඩා ම ඒකකය යි.

> "ආහාරමය අගයක් හෝ පෝෂණීය ගුණයක් ගැන සඳහනක් නොවෙතත් පුවක්, බුලත් විට කෑමට බහුල ලෙසම යොදා ගනී. විට කෑමට ගොලෑ පුවක් හා රබ්බඩ පුවක් නොවූ විට මඩ පුවක්, පල් පුවක් හෝ කරුංකා ඒ සඳහා සුදුසු වේ. පැසුණු හෝ රබ්බඩ පුවක් අව්වේ හෝ දුම් මැස්සේ දමා වේලීමෙන් කරුංකා සකස් කරගනී. මෙය පුවක් හිඟ කාලයට ප්‍රයෝජනයට ගනු පිණිස පුවක් කල්තබා ගන්නා එක් ක්‍රමයකි. පැරණි ගෙවල කරුංකා ගබඩා කිරීමට තැනූ අටු තිබේ. ඒවා කරුංකා අටු ය. මඩ පුවක් දැමීම සඳහා ගන්නේ රබ්බඩ පුවක් ය. මඩ රහිත දිය නොසිඳෙන වැලි සහිත ඇල ඉවුරක් හෝ දිය කඩිත්තක් මේ සඳහා තෝරා ගැනේ. පුවක් ඇති ප්‍රමාණයට අනුව වලක් හාරා එහි පතුලට හා හතර වට ට අමු බට කොල අතුර යි. ඉන් පසුව පුවක් ඒ තුළ තැම්පත් කර නැවත බටකොල තට්ටුවක් අතුරා වැලිවලින් වසා දමයි. වලට මතුපිටින් නිතර ජලය රැඳී තිබිය යුතු ය. ජලය සිඳීගිය හොත් පුවක් පැලවෙයි. නැවත ජලයෙන් යටවුනහොත් කුණු වෙයි. මඩ පුවක් සඳහා ගොලෑ දැමුව හොත් මද කුණු වේ. එවිට මඩ පුවක්වල අගයක් නැත" (කළ්‍යාණවතී, 2011.01.04).

"මඩ පුවක් මාස හතරක් පහක් පමණ මෙසේ කල්තබා ගත හැකි ය. දෙසැම්බර් අවසන් වනවිට මඩ පුවක් ගොඩගනී.'මඩ පුවක් දාන්ඩ පුවක් ගහක පළමුවෙනි වල්ල ගන්නේ නෑ. දැම්මොත් කුණු වෙනව දෙවැනි තුන්වැනි වල්ලේ ඉදල තමයි මඩ පුවක් දාන්ඩ ගන්නේ" (ජයසේන, 2010.12.20). "පල් පුවක් මඩ පුවක් වලට වෙනස් වේ. ඒවා මඩ පුවක් වලට වඩා ගණයෙන් හා මිලෙන් අඩු ය. පල් පුවක් සඳහා රබ්බඩ පුවක් සේම ගොලෑ පුවක් ද ගනී. මේවා ගෝනිවල බහා හෝ නැතිව ටැංකි, බැරල්, කල ආදියෙ හි ජලය පුරවා තැම්පත් කර තැබේ. මේ පුවක් අධික දූර්ගන්ධයෙන් යුක්ත ය. ලෙල්ල සේම මදය ද කුණු වී ඇත" (රාජපක්ෂ, 2010.12.30). "පෙති පුවක් කියා තවත් වර්ගයක් තිබේ. මේවා ගොලෑ පුවක් පෙතිගසා අව්වේ වියලා ගනී. මේවා පෙති කපන බැවින් පෙති පුවක් වේ. පෙති පුවක් වල කහට ගතිය වැඩි ය. මිල අධික වන අතර වර්ණ සෑදීම සඳහා කහට ලබා ගැනීමට අපනයනය කෙරේ. ආයුර්වේද වෙදකමේ දී පෙති පුවක් ඖෂධයකි. ඒ බඩ විරේක කිරීමේ ගුණයක් එහි පවතින බැවිනි. රබ්බඩ පුවක් ඉස්ම නොහොත් රබ්බඩ පුවක් පැණි බඹර, මී පැණි හා දඬුවැල් මැසි විස නැසීම ට අත්බෙතකි. ගෝණුසු හා පත්තෑ විස නැසීමටත් එය ගැමියන් අතර ප්‍රචලිත ය. රබ්බඩ පුවක් ගෙඩි සැපීමට ළදරුවන්ට ඉඩ නොදෙන්නේ දත් නරක් වේ යැයි මව්වරුන් විශ්වාස කරන නිසා ය. එහි පැණි රස කිරි දත් වලට අගුණ යැයි ඔවුන් සිතනවා විය හැකි ය. කරුංකා පුවක් පුළුස්සා දිය ලුණු මිශ්‍රකර දත් මැදීම දත් ශක්තිමත් වීමට හේතු වේ. ඇතමුන් දුන් කුඩු ඉරීමට කරුංකා පුවක් ගෙඩිය සුද්ද කර පයිප්පයක් ගසා සකසා ගෙන තිබේ" (හෙන්රි, 2010.12.30). "මඟුල් ගෙවල්වල දී බත ඉදෙන විට කරුංකා පුවක් ගෙඩි දෙක තුනක් ඊට එක් කරන්නේ අසීමිත ලෙස ආහාර ගැනීම වලක්වන අටියෙනි. එවිට ආහාර ගන්නා විට මත් බවක් ඇතිවේලු" (සෝමවතී, 2010.12.20).

> "කරුංකා පුවක් ලෙල්ල විසිතුරු මෙවලම් සැදීමේදී අමුද්‍රව්‍යයකි. ගැමියාට නම් බුලත් පාත්තියට හොඳ පෝරකි. මදුරුවන් පලවා හැරීම ට දුම් ගසන්නට හැකි ද්‍රව්‍යය කි. ගොලෑං පුවක් මන්තර ගුරුකම් සඳහා ද යොදා ගත් බව පෙනේ. 'අමු පුවක් ගෙඩිය කඩලා ගෙඩිය පිටින් සුද්ද කරගන්ඩ ඕන. ඊට පස්සේ මේක වෙන් නොවෙන්න හතරට පලලා ඒකට මතුරලා පුළුවන් කටහඬ හිර කරන්න. නඩුවකට හෝ වේවා සාක්කි කාරයෝ ඉන්නවානේ, පුවක් ගෙඩියට මතුරලා ඒක අතේ හිරකරගෙන ඉන්නවා. අත මිටමොලෝ ගත්තහම පුවක් ගෙඩියේ කටවල් වැහෙනවා. එතකොට කතාකරන කෙනාගේ හඬක් පිටවෙන්නේ නෑ. අත දිගාරිනකම් කතාකරනව බොරු. දැනුත් මේවා නැත්තේ නෑ. සේරෝම තියෙන්නේ හාමුදුරුගොල්ල ගාව" (පියදාස, 2010.12.20).


අවුරුදු කාලෙට ඈත ගම්වල ගැමි දරුවන්ගේ ක්‍රීඩාවකි "පුවක්කිරීම". මෙය ටීක් බෝල ක්‍රීඩාව ඇසුරින් බිහිවූවක් ලෙස අනුමාන කළ හැකි ය. සමතලා ගෙමිදුලක අඟල් හතරක් පහක් පමණ ගැඹුරු වළක් හාර යි. පුවක් ගෙඩි කීපයක් දැමිය හැකි පරිදි එහි පළල තිබිය යුතු ය. වළ සමීපයේ සිට අඟල් හයක් පමණ මෙපිටින් ඉරක් අඳී එය එඟන් ඉරයි (එඟන් ඉරට ඉපිටිනි වළ ඇත්තේ) ඒ ඒ ක්‍රීඩකයෝ යම් නිශ්චිත දුරක සිට තමාගේ වාරයේ දී පුවක්කිරීම සිදුකල යුතු ය. තම වාරය තුළ දී වල තුළ ට වැටෙන පුවක් ඔහු ට හිමිවන අතර පුවක් වලට වැටී එඟුන් ඉරෙන් මෙහා කිරූ පුවක් තිබුන හොත් පෙන්දාගෙන් (මෙය වලං

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
ISSN 1800-1459

හෝ ගල් පතුරක් විය හැකි ය) එම පුවකයට එකවර එගන් ඉරෙන් එහාට යන්නට ගැසිය යුතු ය. එම උත්සාහයේ දී වෙනත් පුවක් ගෙඩියක වැදුනහොත් දඩ ගෙවීමට සිදුවේ. දඩ ගෙවිය යුත්තේ පුවක් ගෙඩි වලිනි. මේ අයුරින් විවිධ ප්‍රදේශවල විවිධ නීති රීති යටතේ පුවක් කිරීම ගැමි දරුවන් අතර ජනප්‍රිය ක්‍රීඩාවකි.



කරුංකා සඳහා පුවක් වේලීම



කොළපත් ගොටු

හැම කාලයේම පුවක් හැදෙන්නේ නැත. බොහෝවිට වසරකට දෙවර කි. ඇතැම්විට අවාරයේ දී මඩ පුවක් කරුංකා හෝ පල් පුවක් ද නැතිවන අවස්ථා එමට ය. පුවක් නොමැති වුව ද විට කෑම අත් හැරීම ගැමියාට කළ නොහැක්ක කි. ඒ නිසා ඇහැල පොතු, ගොන්න පොතු, අට්ටික්කා පොතු, ලේන් තිරි (ලේන් තැරි), කුරුම්බා ඇට්ටි පමණක් නොව කිතුල් ඇට ද ප්‍රයෝජනයට ගන්නා අවස්ථා නැත්තේ නොවේ.

> "පුවක් ගසේ ඉහලම කොටස පුවක් කරටිය යි. අළුත් පුවක් අතු හටගන්නේ එහි ය. එය ඉහලින් පුවක් කරබඩය තිබේ. පුවක් අත්තක් වන්නේ එය ය. පුවක් බඩය (ඉහල කොටස) ආහාරයට ගත හැකි ය. 'පුවක් බඩේ තලල ඒක කැලි කපල නැත්තං ලියලා උණුවතුරින් හොදට තම්බ ගන්න ඕන. ඊට පස්සේ මිරිකලා අරං හොදට කිරිදාලා උයන්න පුළුවනි. අමුවෙන් කන්නත් පුළුවන්. එතකොට මත්වෙනවා" (ගුණවතී, 2010.12.29).

## පුවක් ගස හා බැඳි භාෂා ව්‍යවහාර

මිනිසාගේ ජීවන ව්‍යවහාර සමඟ භාෂා ව්‍යවහාරය තදනුබද්ධ ය. එබැවින් පුවක් ගස වටා වැටුණු ජීවන ව්‍යවහාර විමසීමේ දී ඒ සමඟ නිර්මාණය වූ භාෂා ව්‍යවහාරයන් ද ඉහතින් විස්තර විනි. ඒ මිනිසා නැවත එම කරුණු විස්තර කරනු වෙනුවට ඉන් ගිලිහුණු ඇතැම් භාෂා ව්‍යවහාරයන් මෙහි දී ඉදිරිපත් කරමු.

පොදුවේ ''පුවක්'' කියා එක් විශේෂයක් හඳුනා ගත්ත ද ගැමියන් පුවක් ප්‍රභේද කිහිපයක් හඳුනයි. මන්නාරම් පුවක්, හම්බන් පුවක්, රට පුවක්, නැව් පුවක් හෝ ඉන්දියන් පුවක් හා සිංහල පුවක් යනුවෙනි. මේවායේ ගති ලක්ෂණ, ස්වභාවය එකිනෙකට වෙනස් ය. හම්බන් පුවක් ප්‍රමාණයෙන් ලොකුය දිගටිය. නමුත් එහි මද (ගෙඩිය) කුඩා ය. ඉන්දියන් පුවක් නොහොත් නැව් පුවක් ගෙඩිය විශාල වුව ද විට කෑම සඳහා උචිත නොවේ. එහි මද දැඩි කිරි සහිත ස්වභාවයක් ගන්නා

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79
ISSN 1800-1459

බැවිනි. රට පුවක් මදය සාමාන්‍යය පුවක් වලට වඩා ලොකුය. වට කුරු ය. සිංහල (හිංගල) පුවක් යනු ගෙවතු හා ලඳු කැලෑවල වැවෙන සාමන්‍යය පුවක් ය. ලේන් තිරි නොහොත් ලේන්තැරි හා දෝතලු ද පුවක් වර්ගයට අයත් ගස් බව ගැමියන්ගේ විශ්වාසයයි. ලේන්තිරි ගම්මාන අශ්‍රිතව හමුවෙතත් දෝතලු හමුවන්නේ තෙත් කලාපයේ ඝන වනාන්තර වල දිය සීරාව සහිත දළ බෑවුම් වල දී ය.






රට පුවක්

හිංගල පුවක්

ලේන්තිරි ඉතා කුඩා ගෙඩි විශේෂය කි. එක් වල්ලක ගෙඩි සිය ගණනකි. ඉදුණු පසු තද රත් පැහැයක් ගනී. දෝතලු ඝන වනාන්තරවල දියසීරාව ඇති ස්ථානවල හැදෙන ලේන්තිරි ගසට සමාන ගසකි. මෙහි කඳ සේම පත්‍ර නාරටිය ද ලා රත් පැහැයක් ගනි. දෙවියන් උදෙසා කෙරෙන පූජා සඳහා දෝතලු මල් විශේෂ වැදගත් කමක් ගනී. මේවා සොයා ගැනීම දුෂ්කර වන බැවින් දෝතලු මල් පූජා කිරීමෙන් බොහෝ පිං ලැබෙන බව ගැමියන්ගේ විශ්වාසයකි.





පුවක් වැටියක්

තේ වගාව සමඟ සාර්ථක පුවක් වගාවක්

මේ විවිධ පුවක් වර්ග අතර ''වෙඩි පුවක්'' ද වෙති. එනම් ඒවා සමඟ විට කෑ විට මත්වන පුවක් ය. මේවායේ කහටගතිය අඩුය. ගැමියන් එබදු පුවක් ගස්වල ගෙඩි සමඟ විට නොකෑමට ප්‍රවේශම් වෙති. පුවක් ගෙවතු ආශ්‍රිතව ''ඉබේම'' පැලවෙනුවා සේම නිසි ආකාරයට සිටුවන අවස්ථාවන් ද වේ. ස්වභාවික පුවක්

ගස් පැතිරි ඇති ප්‍රදේශයක් ''පුවක් මණ්ඩියකි.'' පුවක් අරඹ මින් වෙනස් වේ. පුවක් අරඹක විවිධ මට්ටමේ පුවක් ගස් ඇත. එය දීර්ඝ කාලයක් තිස්සේ පුවක් ගස් ප්‍රමුඛව ව්‍යාප්ත වූ භූමියකි. පහතරට ''තේ'' වගාව ව්‍යාප්ත වීම සමඟ දකුණු හා සබරගමු පලාත්වල වූ පුවක් අරඹවල් රාශියක් විනාශ විණි. ''තේ'' වගා බිම්වල වැට මායිමේ වලට පුවක් ගස් සිටුවීම ලංකාවේ වඩාත් ප්‍රචලිත ය. එබඳු පුවක් වගාවක් පුවක් වැටියකි.

පුවක්වත්ත, පුවක්හේන, පුවක්පිටිය, පුවක්දණ්ඩාව, පුවක්ගහවෙළ ආදී ''ගම්'' නම් වලට මුල් වී ඇත්තේ ද පුවක් ගස් ය. පරකඩුව ග්‍රාමයේ තිබෙන ''පුවක් වත්ත'' ප්‍රදේශයට එම නාමය ලැබී ඇත්තේ වතු සමාගම් විසින් රබර් වගාව ආරම්භ කිරීමට ප්‍රථම ප්‍රදේශයේ යායක් ලෙස පුවක් ගස් පැතිර තිබීම ය. සෙසු ග්‍රාම නාම වල ද උපත පරීක්ෂා කළ විට මෙබඳු අත්දැකීම් ලද හැකි ය.

## ජන සාහිත්‍යය

පුවක් ගස සමඟ බැදි ජන කවි, ජනකතා, ප්‍රවාද තේරවිලි, උපමා රූපක ආදිය පිළිබඳව මේ යටතේ අවධානය යොමු කෙරේ. පුවක් ගෙඩි ඒ ඒ වර්ධන අවධි වලදී ඒ ඒ පැහැගනී. මෙම සිද්ධිය සියුම් ව නිරීක්ෂණය කළ ගැමියා අපූරු තේරවිලි කවියක් ලෙස තම අත්දැකීම ප්‍රකාශයට පත්කළ හැටිය මේ.

පොඩිකාලේ ඇඟලන්නේ නිල් හැට්ට
ලොකුවෙන කොට ඇඟලන්නේ රතු හැට්ට
කුප්පි කුප්පි හැරදාලා රට යන්නේ
මෙතුන් පදේ තෝරාලා විට කන්නේ

තේරවිලි කවියක් වශයෙන් බුලත් විට පිළිබඳව ලියැවුණු තවත් එක් කවක් මෙසේ ය.

නාග ලොවේ සිට මිනිහෙක් ඇවිදින්
බෙල්ල කැඩීලා දොයි
තව එක මිනිහෙක් ගහෙන් වැටීලා
සතරට පැලිලා දොයි
තව එක මිනිහෙක් අව්වට දාලා
වැස්සට තෙමිලා ශෙයි
යන මේ තුන්දෙන සමගි කරන්නට
මැරිච්ච මිනිහෙක් එයි

බුලත නාග ලොවේ උපන් දෙයක් බව සම්මතය. නැට්ටෙන් කඩන ලද බුලත් කොලයට ගහෙන් වැටුන පුවක් ගෙඩිය සතරට පලා කැබැල්ලක් ද ගින්නෙන් පුළුස්සා දිය ගසා ගත් හුනු ටිකක් එක් කොට සැපූ බුලත් විට පදම් වීමට මැරිච්ච මිනිසා නැමැති දුම්කොළ ටිකක් ද කටේ ඔබා ගනිති (මහේන්ද්‍ර, 1993:147). ''තව එක මිනිහෙක් ගහෙන් වැටීලා සතරට පැලිලා දොයි'' යන්න ''රබ්බඩ පුවකේ දෙකට කපාලා හතරට ඉරු කර තෙයි'' යනුවෙන් තෝරා ඇත'' (කළ්‍යාණවති, 2011.01.04).

අප කවුරුත් දන්නා කොරවක්කා පිළිබඳ ජන කතාවක් තිබේ. කොරවක්කා වූයේ පුවක් වෙළෙන්දෙකි. ඔහු පුවක් මිලට ගෙන ගමරට යන අතර ගඟකින් එතෙර වීමට සිදුවිය. පුවක් සියල්ල පාරුවක පටවාගත් වෙළෙන්දාට ගඟ මැදදී වූයේ මහත් අකරතැබ්බයකි. පාරුව පෙරලී ගියේ ය. පුවක් ගංදියේ විසිරී ගිය අතර වෙළෙන්දා දියේ ගිලුණි. වෙළෙන්දා කොරවක්කෙක් වී ඉපදී ''කෝ මගේ පුවක්, පුවක් "කියමින් කෑ ගසමින් තාමත් ගංඉවුරු වල පුවක් සොයමින් ඇවිදින්නේ ලු.

පුවක් වෙළදාම හා සම්බන්ධ මෙබඳු ජන ප්‍රවාදයක් නිල්වලා නිම්නයෙන් ද හමුවේ.

> "මොරවක පරගල කට්ටියක් පුවක් ගෝනි ටිකක් පටවගෙන පාරුවකින් ගඟ දිගේ ආවාලු මාතරට විකුණන්න හිතාගෙන. ගඟ දෙපැත්තේ ඔය කෙටල ගාල් උණ පදුරු අස්සේ කොරවක්කන් හෙම ඉන්නවනේ. ඉතින් මේ ගොල්ලන්නේ පාරුවේ සද්දෙට කලබල වෙච්ච කොරවක්කෝ කුරුටු පුවක් පුවක් පුවක් කියල අඬාගෙන හැංගෙනවා පාරුකාරයෝ දැක්කා. කොරවක්කෝ පුවක් ඉල්ලනවා කියලා හිතපු පාරු කාරයෝ අනේ පවු මුන්දලාටත් පුවක් ගෙඩි හතරක් පහක් දාමුකෝ කියලා ගඟ දිගටම කොරවක්කෝ අඬන හැම පදුරක් අස්සටම පුවක් විසිකර කර ගිහින් අන්තිමට මාතරට යනකොට ගෝනිවල එකම පුවක් ගෙඩියක්වත් තිබුණේ නැතිලු" (හේවගේ, 2011.01.11).

මොරවක, තුම්පනේ මෙන් මෝඩයන් වාසය කළ ප්‍රදේශයක් ලෙසයි ජන ප්‍රවාද වල එන්නේ. මෙබඳු ජනප්‍රවාද වලින් පුවක් වෙළදාම අතීතයේ ව්‍යාප්තව පැවති ආකාරය ගැන අවබෝධයක් ලද හැකි ය.

රබ්බඩ පුවක් ගෙඩියේ මදය පැණි රසයෙන් යුක්තය. තරුණ ගැටව් එහි මදය රූරා කෑමට ගිජු කමක් දක්වති. මෙය අසෝබන ක්‍රියාවක් ලෙස දකින වැඩිහිටියන් පවසන්නේ "ඕවා කෑවා වගෙයි නෙවෙයි පුතෝ උඹේ මඟුල් දවසෙ ගොනෙක් ඇන්නම" කියාය. නව යෞවණ වයසේ පසුවන ගැටයෙක් පුවක් මදයක් කා මඟුල් දවසේ ගොනෙක් අනිනවා අත්දැකීමට නොකැමැත්තෝය. ඒ නිසා අකමැත්තෙන් වුව ද පුවක් ගෙඩියේ මද කෑමේ පුරුද්දෙන් වැළකීමට ඔවුහු උත්සාහ කරති.

රබ්බඩ පුවක් දුටුවිට "රබ්බඩ අයියා ද" සිහිවන්නේ නිතැතිනි. රබ්බඩ අයියා මහදන මුත්තාගේ ගෝලයන්ගෙන් අයෙකි. මහදනමුත්තයි ගෝලයො රොත්තයි චිත්‍රයට නඟන චිත්‍ර ශිල්පියා රබ්බඩ අයියා චිත්‍රයට නගන්නේ පෘෂ්ටිමත් සිරුරක් ඇති රතු ඉලන්දාරියෙකු ලෙසයි. එනම් රබ්බඩ පුවකයක හැඩහුරුකම ඇතිවයි.

අතීතයේ මනාලයන් මනාලියගේ ගෙදරට ඈ බැලීමට ගිය විට මනාලියගේ පියා, එනම් මාමණ්ඩිය සිය අනාගත බෑණාගේ ගති සොබා පරීක්ෂා කර බැලීම අනිවාර්යය විය. මොනවා ගැලපුණත් මෙම පරීක්ෂණ වලින් අසමත්වන අයකු තම බෑණා කර ගන්නට මනාලියගේ දෙමාපියෝ කැමති නොවෙති. ඉන් එක් පරීක්ෂණයක් වන්නේ බුලත් හෙප්පුවට සියලු අඩුම කුඩුම තබා පුවක් ගෙඩිය පමණක් නොකපා පිහිය සමඟ මනාලයාට පිළිගැන්වීමයි. මනාලයා විට කන්නේ

නම්, පුවක් ගෙඩියම කපා ශුද්ධ කර තමාට අවශ්‍ය පමණ ගෙන ඉතිරි පුවක් කැබලි හෙප්පුවට දැමීම මනාලියගේ පාර්ශවයෙන් අපේක්ෂා කරයි. තමාට අවශ්‍ය කොටස පමණක් සුද්දකර කා ඉතිරි කොටස් නැවත හෙප්පුවෙහි තැබුවහොත් හෝ විසිකළහොත් මනාලයා පරීක්ෂණයෙන් අසමත් ය. එවිට ආත්මාර්ථකාමියෙක් සේම අසත් පුරුෂයෙක් ලෙස ද සැළකේ.

මෙබඳු තවත් පරීක්ෂණයක දී මාමණ්ඩිය තම අනාගත බෑණාට කුඹුරට හෝ හේනට යම් රාජකාරියක් සඳහා යාමට ආරාධනා කරයි. ඒ සමඟ පරීක්ෂණය ඇරඹේ. හේනට, කුඹුරට යාමට සුදානම් වීම, ආයුධ තෝරා ගැනීමේ සිට බෑණාගේ සියලු ක්‍රියාකාරකම් මාමණ්ඩිය හොර රහසේ නිරීක්ෂණය කරයි. මේ යන අතරමග දී මාමණ්ඩිය විටින් විට විටට අවැසි ද්‍රව්‍ය වන පුවක්, බුලත් හුණු, දුංකොළ ආදිය බෑණා අත තබයි. සියල්ල එකවර දෙන්නේ නැත. මනමාලයා පරීක්ෂණයෙන් සමත් වන්නේ ඉවසීමෙන් හිඳ අවසානයේ සියලු අඩුම කුඩුම එකතු කර ගෙන බුලත් විටක් සැපීමට සමත් වුවහොත් පමණි.

"රා බොන්නට කොළපත පෑවා වගේ" යන්න සිංහරාජය ආශ්‍රිතව පවතින පිරුළකි. මෙම පිරුළ ඇති වීමේ කතා පුවත මෙසේය. 'එක කාලෙක සිටිය බොහොම ඇස්වහ කටවහ තියෙන මිනිහෙක්. මිනිහා රා බොන්ඩ හරිම කැදරයි. ඒත් මල් කපන්නන් කැමති වුණේ නෑ එයාට රා දෙන්න. ඇයි ඉතිං බීලා මොනව හරි කට කැඩිච්ච කතාවක් හෙම කිව්වොත් කියල. ඔන්න දවසක් මනුස්සයෙක් හොඳටම පැහුණු රා මුට්ටියක් අරන් කිතුලෙන් බහින කොටම ආවෙ නැතෑ අර ඇස්වහකාරයා. රා මදින්නට දුන් මේ මිනිහට රා ටිකක් දීලත් බෑ නොදිත් බෑ. මිනිහ මේකට උපායක් කල්පනා කරල කිතුල් ගහේ එහා පැත්තෙ ඉඳගෙනම ඇහුවා උන්නැහැ ඒහෙනං රා ඩිංගිත්තක් හෙම බොමු ද කියල. ඇස්වහකාරයට ඉහේ මලක් පිපුණ ගානයි. කැදරකම වැඩිකමට ළඟම තිබුණ කොළපොතක් අරං මල් කපන්නා දිහාවට පෑවා. මල් කපන්නා කොළපතට රා වත්කරන කොටම ඇල වුන් නැතෑ කොළ පොතේ එක පැත්තක්. අර මිනිහා මොකද කුළේ ටක් ගාලා අතින් අතින් කොළපතේ අනෙක් කෙළවරක් අල්ලා ගත්තා. හැබැයි රා ටික යනවට හදිස්සියට අත දැම්මේ කිතුල් ගහේ අනෙක් පැත්තෙන්. දැන් කිතුල් ගහ මැද මිනිහා එක පැත්තක. මල් කපන්නා සේරම රා ටික කොළපතට හලලා,. "එහෙනම් උන්නැහේ බීලා බලනවා කියලා යන්න ගියා. ඇස්වහ කාරයාට රා බොන්න බෑ. මැද කිතුලනේ. අතමාරු කරන්නත් බෑ. රා ටික හැලෙනවනේ. කොහොමින් හරි ඇස්වහ කාරයාට රා ටික බොන්ඩ බැරි වුණාලු (හෙන්රි, 2010.12.30 ).

"ගිලීමලෙත් ඇත දත සුද්දෝ" යන්න ප්‍රචලිත සිංහල ජන කියමනකි. ඉන් අදහස් කෙරෙන්නේ යම් සුලබ පුද්ගල කණ්ඩායමක් අතර වුව ද දුලබ අයෙකු සිටිය හැකි බව යි. ගිලීමලේ යනු සමනල කඳු වැටිය පාමුල පිහිටි ඉපැරණි ගම්මානයකි. අතීතයේ සිටම මෙම ප්‍රදේශය පුවක් සඳහා ප්‍රසිද්ධ වූ බව සාහිත්‍ය මූලාශ්‍ර වල ද සඳහන් ය. (තවත් අය මෙය බුලත් සඳහා ද සම්බන්ධ කරති) මෙම ප්‍රදේශයේ ජනයා අසාමාන්‍ය ලෙස විට කෑමට පුරුදුව සිටි බැවින් ඔවුන්ගේ දත්වල නිරන්තරයෙන් කහට බැඳී තිබුණේ ලු.

මම හරියට "ගිරයට අහුවෙච්ච පුවක් ගෙඩියක් වගේ" යැයි කෙනෙක් පවසන්නේ පාර්ශව දෙකක් අතර හෝ අවස්ථා දෙකක් අතර හෝ මානසික හෝ කායික පීඩාවට ලක්වන්නට සිදු වූ විට ය."අපි ඉතිං පුවක් ගහක ගියත් දෙබලක්නේ"යැයි යමෙකු පැවසුවහොත් ඉන් අදහස් කෙරෙන්නේ ඔහු කළ කාරිය අනපේක්ෂිතව ව්‍යර්ත වූ බව කි. මන් ද පුවක් ගස්වල දෙබල් හටගැනීමක් නැතහොත් කරු බෙදීමක් සිදු නොවන බැවිනි. එවිට යමෙකුගේ බලාපොරොත්තු "පුවක් වල්ල ගලේ ගැසුවාක් මෙන්" විසිරී යාමට ද පුළුවන. ඒත් පසුගිය කාලයේ එබදු අතුබෙදී ගිය පුවක් ගසක් ගැන ප්‍රවෘත්ති වාර්තා පළ විය. කලියුග කාලෙට ලබු තිත්ත වීමත් පුවක් ගසේ කරු ඒමත් සිදුවන බව ජන පිළිගැනීම කි.

## පුවක් ගස හා බැඳි ජන සංස්කෘතියේ අනාගතය

පුවක් ගස හා බැඳි ජන සංස්කෘතිය මෑත කාලීනව දැඩි වෙනස් කම් වලට ලක්වෙමින් තිබේ. ඕනෑම සමාජයක මානව සබඳතාවල කාලීන සහ අවකාශිය වෙනස්කම් අපේක්ෂා කළ යුතු වුව ද එම වෙනස්කම්වල බලපෑම සමාජ ප්‍රගමනය උදෙසා දායක නොවන්නේ නම් එබඳු තත්ත්වයන් සමාජීය වශයෙන් යම් ගැටළුකාරී පසුබිමක් නිර්මාණය කරනු ඇත. ඕනෑම ශාඛයක් වටා මානව සබඳතා නිර්මානය වීමට එම ශාඛය සජීවී ව පැවතීම අවශ්‍ය ය. අනෙක් කරුණ නම් එම ශාඛයෙන් ලබා ගන්නා ප්‍රයෝජනවල ස්වභාවය අනුව ද මෙම මානව සබඳතා නිර්මානය වීම සහ පවත්වා ගැනීම සිදු වේ. පුවක් ගස අතීතයේ වර්තමානයටත් වඩා පුද්ගලයාගේ සමාජීය ආර්ථික සහ සංස්කෘතික සබඳතා සමඟ තදනුබද්ධ ව පැවති බව ඉහත සාකච්ඡාව මඟින් අනාවරණය විය. නමුත් වත්මන වනවිට මෙම සබඳතා බොහොමයක් ලිහිල් ව යාමක් හඳුනාගත හැකි ය. එයට හේතු කීපයක් බලපා තිබේ. ඉන් පළමුවැන්න නම් වත්මන් පුද්ගල අවශ්‍යතා ධූරාවලියේ පුවක් ගස එම අවශ්‍යතා තෘප්ත කිරීමේ ප්‍රාථමික අවධියක පැවතීමයි. නිදර්ශනයක් ලෙස නිවාස සහ ගොඩනැඟිලි ඉදිකිරීමේ දී පුවක් ගස අතීතයේ මෙන් මූලික අමුද්‍රව්‍යයක් නොවේ. එය අතුරු අමුද්‍රව්‍යයකි. විට කෑම ද බොහෝ විට ග්‍රාමීය ප්‍රදේශවලට සීමා වී තිබේ. තව දුරටත් එය සමාජයේ ගෞරවයට පාත්‍ර වූ ක්‍රියාවක් නොවේ. විට කෑම පාලනය සඳහා මේ වන විට නෛතික සීමා පවා පනවා තිබේ. මෙබඳු තත්ත්වයන් විට කෑම තවදුරටත් දිරිගන්වන්නේ නැත. පුවක් ගසෙන් ගන්නා වෙනත් කොටස් වල ද තත්ත්වය එය යි. කොළපත් ආහාර රැගෙන යාමට සකස් කර ගැනීමට බොහෝ දෙනෙකුට දැනුමක් නැත. සකසා ගත්තත් එය තැම්පත් කිරීමට අටුවක් නූතන නිවෙස්වල නොමැත. එනිසා දුම නැති නිවසට කොළපත අවශ්‍ය නැත. කොළපතින් ඉටුකල කාරිය වෙනයම් කෘතීම මෙවලම් වලට හුවමාරු වී තිබේ.

දෙවණ කරුණ නම් මෙවැනි සමාජ වෙනස් කම් හේතුවෙන් මෙතෙක් කාලයක් පුවක් ගස වටා ගොනු වූ මානව සබඳතා වලින් ජනිත සම්ප්‍රදායික දැනුම, ජන සාහිත්‍යය වත්මන් පරපුර වෙත වහනය නොවීමයි. මෙය ආකාර දෙකකින් බලපෑම් ඇති කරයි. පළමුව පුවක් ගස තවදුරටත් ප්‍රයෝජනවත් ශාඛයක් නොවී සමාජ සබඳතා වලින් වියුක්තව ජන විඥානයෙන් මැකී යාම යි. දෙවැන්න නම් එසේ ඉවත්වීම තුළ එම ශාඛයේ සජීව පැවැත්ම පිළිබඳ බරපතල ගැටලු මතු වීමයි. යටත් විජිත වතු වගාව සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් එසේ

තර්ජනයට ලක් වූ ශාඛ විශේෂ කීපයක් දිවයිනේ පවතී. වියළි කලාපයේ "වීර" එබඳු ශාඛයකට එක් නිදර්ශනයකි.

මෑත කාලීන ව සීඝ්‍රයෙන් වෙනස් වන භූමි පරිහරණ රටාවන් ද පුවක් ගසේ සජීව පැවැත්මට තීරණාත්මක බලපෑමක් සිදුකර තිබේ. විශේෂයෙන් ම පුවක් ශාඛයේ පුළුල් ව්‍යාප්තියක් පෙන්වන තෙත් කලාපය තුළ අධික ජන සංකේද්‍රණයක් දැකිය හැකිය. ඔවුන්ගේ අවශ්‍යතා තෘප්ත කිරීමට නව ඉඩම් අවශ්‍යය වේ. ඒ වෙනුවෙන් පුවක් බහුල භූමි එළිකිරීමට සිදුව තිබේ. සීමා රහිතව ව්‍යාප්ත වන පහත රට තේ වගාව පුවක් ගසේ පැවත්මට දැඩි තර්ජනයකි. විශේෂයෙන් ම පුවක් ගස බෙහෙවින් ප්‍රිය කරන දිය සීරාව සහිත බෑවුම් ප්‍රදේශ තේ වගාව නිසා විනාශ වී තිබේ. තේ ප්‍රධාන ආදායම් භෝගය වන විට පුවක් අප්‍රධාන වන අතර ම එය භූමියෙන් ඉවත් වන්නේ නිරායාසයෙනි. මෙබඳු තත්ත්වයන් පුවක් ගසේ පැවැත්මත් මානව සබඳතා වියමන ඉරා දැමීමට හේතු වී තිබේ.

කෙසේ වුවත් මෑත කාලයේ දිවයිනේ වනාන්තර පර්යන්ත ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලද ප්‍රජා සහභාගීත්ව වන කළමනාකරණ ව්‍යාපෘති සහ කෘෂි වන වගා ප්‍රවේශවල දී පුවක් ගස එක් ප්‍රධාන ශාඛයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම ප්‍රවේශයන් අගනා ප්‍රයත්නයන් ලෙස සැලකිය හැකි අතර ඉන්දියාව, නේපාලය, තායිලන්තය, බුරුමය, පිලිපීනය, ආදී රටවල මෙබඳු ප්‍රවේශයන් සාර්ථක ප්‍රතිඵල ලබා තිබේ. මෙහි අඛණ්ඩ පැවැත්ම සඳහා මානව සබඳතා ද අත්‍යවශ්‍ය වන බැවින් සම්ප්‍රදායික දැනුම් පද්ධතිය ද අනාගත පරපුරට උරුම කිරීමේ ක්‍රමෝපායන් ඉහත වැඩසටහන්වලට ඇතුලත්වීම වඩාත් යෝග්‍ය වේ. ඇතැම් පැරණි සබඳතා ගිලිහී යද්දී නව සබඳතා ඇතිකරගැනීම ද අපේක්ෂා කළ යුතුය. කොළපත් වලින් විසිතුරු භාණ්ඩ සාදා අපනයනය කිරීම එබඳු සබඳතාවකට නිදර්ශනයකි.

## නිගමනය

යම් ශාකයක් වටා මානව බැඳීම් නිර්මාණය වන්නේ හුදෙක් අවශ්‍යතාව නිසා ම පමණක් නොවේ. අවශ්‍යතාව ප්‍රමුඛ ම සාධකය වන නමුත් යම් සමාජය්‍යක කේන්ද්‍රීය සාරධර්ම පද්ධතිය විසින් තීරණය කරනු ලබන සොබාදහම කෙරෙහි හෙලන දෘෂ්ටිය ද මේ සඳහා බලපානු ලබයි. යම් සමාජයක ජන ජීවිතය සමග එම පරිසරයේ ඇති ශාඛ සන්තතිය කිසිම ලෙසකින් බැහැර කළ නොහැක. ශාඛ ගෘහස්තකරණය මිනිසා වනජ ද්‍රව්‍ය රැස්කිරීම සම්පූර්ණයෙන් නවතාලීමට සමත් වූයේ නැත. වනාන්තරබද ජනතාව තම දෛනික දිවිපෙවෙත සරිකර ගැනීමට අවැසි වෙනත් දෑ තවමත් සම්පාදනය කර ගන්නේ වනාන්තර වලිනි. නිවර්තන කලාපය මේ යටතේ සුවිශේෂී වේ. ශාඛ හා බැඳි මානව ජීවන ව්‍යවහාරයන්හි තිරසර පැවැත්ම තහවුරු කරනු ලබන්නේ ඉහත දැක්වූ ලෙස ම එම සංස්කෘතියේ කේන්ද්‍රීය සාරධර්ම පද්ධතිය විසිනි. ඒ සඳහා සෑම අවශ්‍යතාවක් සමඟ ම, එහි සෑම යෙදීමක් සමගම සංස්කෘතික පසුබිමක් නිර්මාණය වී තිබේ. තවත් ලෙසකින් පැවසුවහොත් චාරිත්‍ර වාරිත්‍ර ආචාරධර්ම ඇවතුම් පැවතුම් සමූහයකින් එම අවශ්‍යතාවයට පදනම් වූ සබඳතාව තිරසර ලෙස තහවුරු කොට තිබේ. භාෂාව මෙහිදී වඩා සුවිශේෂී වන අතර එය කිසිලෙසකින් ඉන් වියුක්ත වන්නේ නැත.

*සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2013, සත්වැනි කලාපය, පිටු 49-79*
*ISSN 1800-1459*

මෙම අධ්‍යයනයේදී මෙරට ජන සංස්කෘතිය තුළ පුවක් ගස වටා ගොනු වූ සමාජීය සංස්කෘතික සබඳතා ජාලය පරීක්ෂා කරනු ලැබිණි. ඒ අනුව නිගමනය කළ හැක්කේ මෙරට ජන සමාජයේ සමාජ ආර්ථික දේශපාලන හා සංස්කෘතික සෑම ක්ෂේත්‍රයක් හා සමග "පුවක්" ගස බැඳී පවතින බවත්, එම බැඳීම පෙරලා එම ශාඛ සන්තතියේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි ද හේතු වී තිබෙන බවත් ය. එසේ වුව ද මෑත කාලීන සමාජ විපරිවර්තනයන් හමුවේ සොබා දහම හා ගොඩනැගි සෑම සබීදතාවක පැවැත්ම සේම ඉහත සබඳතාවන් ද අභියෝගයන්ට ලක්විම මෑතකාලීන අත්දැකීම යි.

## පරිශීලිත මූලාශ්‍රය

අබේසිංහ, ටී. (2005) *පරංගි කෝට්ටේ*, පන්නිපිටිය, ස්ටැම්ෆොර්ඩ්ලේක්

අමරසේකර, ඩි. සහ දිසානායක, ආර්. (2004) (සංස්) *ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය*, වරකාපොල, ආරිය ප්‍රකාශකයෝ

එල්ලාවල, එච්. (1964) *පුරාතන ලංකාවේ සමජ ඉතිහාසය*, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

*ගංගාරෝහණ වර්ණනාව* (1998) තිලකසිරි, එස්. (සංස්.) කොළඹ, රත්නපොත් ප්‍රකාශකයෝ

ගුණවර්ධන, වී.ඩී.එස්. සංස්. (2009) *කෝකිල සංදේශය*, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ඩේවි. ජේ. (2002) *ඩේවි දුටු ලංකාව*, එච්.එම්. අල්ලේපොළ සෝමරත්න (පරි) බොරලැස්ගමුව, විසිදුණු ප්‍රකාශකයෝ

*තිසර සංදේශය* (1996) තිලකසිරි, එස්. (සංස්) කොළඹ, රත්නපොත් ප්‍රකාශකයෝ

නන්දාරාම, ටි. (1997) *උද්භිත නාම ප්‍රදීපිකා*, කොළඹ, එස් ගොඩගේ සහෝදරයෝ

නොක්ස්. ආර්. (2004) *නොක්ස් දුටු ලක්දිව*, ප්‍රේමචන්ද්‍ර අල්විස් (පරි) කොළඹ, සූරිය ප්‍රකාශකයෝ

පිරිස්, ආර්. (2001) *සිංහල සමාජ සංවිධානය, නුවර යුගය*, බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ

*මහාවංශය (සිංහල)* (2008) විමලජෝති, කේ. (සංස්.) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

මහේන්ද්‍ර, එස්. (1993) *සිංහල කයිකතන්දර*, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ

__________ (1995) *පුවක් මල් කුමාරි*, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ

මද්දුමාගේ,එම්. (1993) *ශ්‍රී ලංකාවේ බිතුසිතුවම් කලාවේ වෘක්ෂලතා නිර්මාණය*, බණ්ඩාරගම, මේධාවී ප්‍රකාශකයෝ

*මානව විද්‍යාව හැඳින්වීම* (2009) ගුණවර්ධන, පී සහ අධිකාජී, ජී. (සංස්) කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ

බිනරගම, ඩී. (2008) *මහනුවර යුගයේ බෞද්ධ කලා සම්ප්‍රදාය*, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ

සැබිහෙල, ඒ.ඊ. (1957) (සංස්) *සිරි රහල් පබඳ*, කොළඹ, ගුණසේන සහ සමාගම

සෝමතිලක, එම්. (2002) *මහනුවර සම්ප්‍රදායේ බෞද්ධ බිතුසිතුවම් කලාව*, කොළඹ, එස් ගොඩගේ සහ සහෝදරයෝ

විජේසේකර, එන්. (2003) *වැද්දන්ගේ විකාශය ක්‍රමය*, කොළඹ, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

______________ (1986) *ලංකා ජනතාව*, කොළඹ, එම් ඩී ගුණසේන සහ සමාගම

වීරසිංහ, ඒ. (1986) *සිංහල ජනශ්‍රැතිය හැදෑරීම*. ගල්කිස්ස: සංස්කෘති ප්‍රකාශකයෝ

Staples,G.W. and Bevaequn R.F., (2006) Areca Catechu (betelnut palm). Kerala: Central plantation, Crops Resarch Institute.

## සම්මුඛ සාකච්ඡා

කල්‍යාණවතී,කේ,බී (56) 2010.10.03, නිල්මිණි උයන, පරකඩුව

සෝමදාස, එම්, එස් (60) 2010.12.20, උඩගම්කන්ද, පොහොරබාව, පරකඩුව

ජයසේන, එම්.එස් (58) 2010.12.20, උඩගම්කන්ද, පොහොරබාව, පරකඩුව

පියදාස, එම් එස්. (61) 2010.12.20, උඩගම්කන්ද, පොහොරබාව, පරකඩුව

සෝමාවතී, කේ. (57) 2010.12.20, උඩගම්කන්ද, පොහොරබාව, පරකඩුව

ගුණසේන, එම්.ඩී. (80) 2010.12.05, ඉහළ ගොඩගම්පල, පරකඩුව

ගුණරත්න, පී (49) 2010.12.30, පෙතියකන්ද, කුඩව, වැද්දාගල

ජෝන්, කේ. (64) 2010.12.29, පෙතියකන්ද, කුඩව, වැද්දාගල

ගුණවතී, පී.සී (60) 2010.12.29, පෙතියකන්ද, කුඩව, වැද්දාගල

සිරිසේන, ආර්.කේ. (65) 2010.12.30, පෙතියකන්ද, කුඩව, වැද්දාගල

ලැයිසා, කේ. (63) 2010.12.30, පෙතියකන්ද, කුඩව, වැද්දාගල

දයාවංශ, පී.එම්, (44) 2010.12.30, දිගන්දල, දෙමුවක, රක්වාන

රාජපක්ෂ, පී.පී. (31) 2010.12.30, කුඩව, වැද්දගල

හෙන්රි. ජේ.එම්.ඩී. (58) 2010.12.30, බුත්කන්ද, කුඩව, වැද්දාගල

බෝගහදෙනිය, සුසන්ත කුමාර (30) 2010.12.30, මහකන්ද, ගනේ තැන්න, හඟුල්වල

ධර්මසේන, කේ.ජී. (47) 2010.12.30, පොල්වත්ත, දූන්කිලවත්ත, මාතලේ

සරත් කුමාර, එම්.කේ. (43) 2010.12.29, අයගම

ගුණරත්න, ජී. (38) 2010.12.29, කුඩව, වැද්දාගල

විමල් ශාන්ත, එන් (37) 2010.12.29, වැද්දාගල හංදිය, වැද්දාගල

ගරුසිංහ, එච්. (58) 2011.01.01, වැලිකැටිය, දෙදියගල, අකුරැස්ස

හේවගේ, ධම්මික, (32) 2011.01.11, වැලිකැටිය, දෙදියගල, අකුරැස්ස

ජයරත්න, ඒ. ආර්. (52) 2011.01.11, වැලිකැටිය, මලිදූව, අකුරැස්ස

කුලරත්න, ඒ. ආර්. (49) 2011.01.11 වැලිකැටිය, මලිදූව, අකුරැස්ස

සරත්චන්ද්‍ර, එච්. (51) 2011.01.11 වැලිකැටිය, මලිදූව, අකුරැස්ස

ජේන්, එච්.කේ. (85) 2011.01.11 වැලිකැටිය, මලිදූව, අකුරැස්ස

දයාරත්න, කේ. කේ. ජී. (54) 2010.11.20, දයාවාස, ගුරුළුවාන, ගිලිමලේ

සෝමපාල, ජී. ආර් (55) 2010.11.19, දිවියගල, ගුරුළුවාන, ගිලිමලේ

ජේම්ස්, පී. එච්. (56) 2010.11.20, ගුරුළුවාන, ගිලීමලේ

රෝසලින්,පී. (77) 2010.12.29, කුඩව, වැද්දාගල

## ඡායාරූප නාමාවලිය

ඡායාරූපයඃ දෙගල්දොරුව විහාරයේ පුවක් ගසක චිත්‍ර සටහනක් (2011.05.16)

ඡායාරූපයඃ කොළපත සුද්ද කිරීම - පෙතියකන්ද (2010.12.30)

ඡායාරූපයඃ පැණිමුල - පෙතියකන්ද (2010.12.30)

ඡායාරූපයඃ පිහි කොපුව, කොළපත් පිඟාන සහ ගොටුව -පෙතියකන්ද (2010.12.30)

ඡායාරූපයඃ කොළපත් තැම්පත් කර තබන අටුව - පෙතියකන්ද (2010.12.30)

ඡායාරූපයඃ කොළපත් හා පුවක් ගසේ අමුද්‍රව්‍ය මඟින් සැකසූ මල් - පරකඩුව (2011.05.16)

ඡායාරූපයඃ කරුංකා සඳහා පුවක් වේලීම - පරකඩුව (2010.12.20)

ඡායාරූපයඃ කොළපත් ගොටු - පෙතියකන්ද (2010.12.30)

ඡායාරූපයඃ රට පුවක් - පරකඩුව (2010.12.20)

ඡායාරූපයඃ හිංගල පුවක් - පරකඩුව (2010.12.20)

ඡායාරූපයඃ පුවක් වැටියක් - පෙතියකන්ද (2010.12.30)

ඡායාරූපයඃ තේ වගාව සමඟ සාර්ථක පුවක් වගාවක් - පෙතියකන්ද (2010.12.30)